# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2449/23 – 2025 අගෝස්තු මස 13 වැනි බදාදා – 2025.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2023/160.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.01.24 දිනැති හා අංක 2420/59 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.01.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කලුතර දකුණ, පරණ පාර, අංක 2/153 ලිපිනයෙහි පදිංචි අයි.ජී.ඩී. ප්‍රියන්ත මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් රත්මලාන, ගාලු පාර, තැ.පෙ. 14 ලිපිනයෙහි පිහිටි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/02/2025 හා 2025.07.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූලි මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 045107 – 18 (2025/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*යොමු අංකය*: IR/COM/04/2023/160

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී.**

අයි.ඒ.ඩී. ප්‍රියන්ත මහතා,
අංක: 2/153, පරණ පාර,
කළුතර, දකුණ.

*පළමු පාර්ශ්වය*

ගොනු අංකය: IR/COM/04/2023/160
නඩු අංකය : A/02/2025

සහ

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
තැ.පෑ. 14,
ගාලු පාර,
රත්මලාන.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින ආරාවුල.

පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම
නියෝජිත නීතිඥ ආර්.ඩබ්.එම්. පොඩිනිලමේ

දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම
ප්‍රධාන නීති නිලධාරී සිතාරා තැඹිලියගොඩ මිය
කලමණාකරු (මානව සම්පත්) එච්.වී.ටී. වික්‍රමරත්න මහතා
නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ නෙත්මි මලවිආරච්චි මිය
නීතිඥ සබනම් රාසික් මෙනවිය
ජ්‍යෙෂ්ඨ මානව සම්පත් නිලධාරී ඒ. පී. ගුණසිරි මහතා

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය ගරු මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව 2025.01.17 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.01.17 වන දින හා අංක IR/COM/04/2023/ 160 ලිපියෙන් ඒ. බී. හේරත් වන මා බේරුම්කරු වශයෙන් පත්කොට මා වෙතයොමු කර ඇත.

**ආරාවුලට තුඩුදුන් කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලයි.

මෙම ආරාවුලට හේතු වී ඇති කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් එච්.කේ.කේ.ඒ. ජයසුන්දර මහතා විසින් නිකුත් කරන ලද ඔහුගේ අංක IR/COM/04/2023/160 හා 2025.01.10 දින ලිපිය " අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ III ශ්‍රේණියේ ජල මනු කාර්මික තනතුරෙහි සේවය කරමින් සිටියදී අබලි ජල මනු වල පිත්තල කොටස් 13 ක් සොරකම් කිරීම යන චෝදනාව මත අයි.ඒ.ඩී. ප්‍රියන්ත මහතාට එරෙහිව පනවනු ලැබූ විනය දඬුවම මගින් ආසාධාරණයක් සිදු වී තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ."

පහත සඳහන් දිනයන් යටතේ නඩු අංක A/60/2024 දින කාර්මික අධිකරණයට දෙපාර්ශ්වයම කැඳවා විභාග පවත්වා ඇත.

| | |
|---|---|
| 2025.02.11 | 2025.06.03 |
| 2025.02.18 | |
| 2025.03.04 | |
| 2025.03.11 | |
| 2025.03.17 | |
| 2025.03.26 | |
| 2025.04.08 | |
| 2025.04.22 | |
| 2025.04.29 | |
| 2025.05.09 | |

**බේරුම්කරණ විභාගයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය**

ඉල්ලුම්කරු වන අයි. ඒ. දීපාල් ප්‍රියන්ත මහතා 1987.11.09 වන දින සිට ජාතික ජල සම්පාදන මණ්ඩලයේ කම්කරුවෙකු ලෙස සේවයට බැඳී ඇති අතර ඉල්ලුම්කරු සිද්ධිය සිදු වන අවස්ථාව වන විට මාපක අලුත්වැඩියා කරන්නා (විශේෂ) // තනතුර / (මණ්ඩල ශ්‍රේණි X1) සේවය කරමින් සිටි බව (ඇමිණුම් A 1) අනුව පෙනී යයි.

මොහු 2010.10.13 වන දින සේවාව නිම වී ප්‍රධාන ගේට්ටුවෙන් පිට වී යාමෙන් පසුව ගල්කිස්ස පොලිසියට 119 ව්‍යාපෘතිය යටතේ ලැබුණු දුරකතන පණිවිඩයක් මගින් වූදිත අබලං ජල මනු පිත්තල කොටස් 13 ක් සමඟ අත්අඩංගුවට රැගෙන අංක 60830 යටතේ නඩු පවරා තිබූ අතර ඉල්ලුම්කරු 2017.01.11 වන දින මෙම නඩුවට අදාළ අධිකරණ තීන්දුව මගින් නිදොස් කොට නිදහස් කර ඇත. (ඇමුණුම් A3)

2010.10.13 ඉල්ලුම්කරු ගල්කිස්ස පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගැනීමෙන් පසු ඉල්ලුම්කරුගේ සේවය 2010.10.21 සිට දෙවන පාර්ශ්වය මගින් තහනම් කර තිබේ. (ඇමුණුම් A 2) ඉන්පසු දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරු වෙත 2012.12.10 චෝදනා පත්‍රයක් ලබා දී ඇත. (ඇමුණුම් A 4 පිටු අංක 35)

2013.01.18 දෙවන පාර්ශ්වය විසින් ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති නඩුවේ තීන්දුව හා ජාතික ජලාපවාහන හා ජලාපවාහන මණ්ඩලය මගින් පවත්වන විනය පරීක්ෂණයේ තීරණයන්ට යටත්ව වූදිත නැවත සේවය පිහිටුවා ඇත. (A5)

2013.09.30 අතිරේක සාමාන්‍යාධිකාරී විසින් 2013.01.19 සිට 2013.02.22 දක්වා පැවති විධිමත් විනය පරීක්ෂණයෙන් පසුව ඉල්ලුම්කරු වෙත දැනුම් දී ඇත්තේ චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා 1 සිට 5 දක්වා චෝදනාවලට ඉල්ලුම්කරු වරදකරු වී ඇති බවයි. මේ අනුව ඉල්ලුම්කරුට පහත සඳහන් දඬුවම් නියම කරන බවයි. (A 6)

i. ජලමනු අලුත්වැඩියා තනතුරේ සිට 14 වන ශ්‍රේණියේ කම්කරු තනතුරට පහත හෙලීම.

ii. වසර 03 ක කාලයක් සඳහා උසස් වීම් අත්හිටුවීම.

iii. වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරු කිරීම.

iv. මින් ඉදිරියට මෙවැනි විෂමාචාරයන්ගෙන් වැළකී කටයුතු කරන ලෙස තරයේ අවවාද කිරීම.

**නිගමන හා නිර්දේශයන්**

මෙම කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වන “ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ iii ශ්‍රේණියේ ජල මනුවක් කාර්මික තනතුරේ සේවය කරමින් සිටියදී අබලි ජල මනුවල පිත්තල කොටස් 13 ක් සොරකම් කිරීම යන චෝදනාව මත අයි. ඒ. ඩී. ප්‍රියන්ත මහතාට පනවනු ලැබූ විනය දඬුවම මගින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේද යන්නයි.’’

මේ පිළිබඳව කාර්මික අධිකරණයෙන් විභාග වලදී අනාවරණය වූයේ අදාළ සිද්ධිය සිදු වීමෙන් පසු ජ්‍යෙෂ්ඨ විමර්ශණ නිලධාරී එච්. වී.ටී. වික්‍රමරත්න මහතා 2010.11.17 මූලික විමර්ශණයක් පැවැත්වීමට සාමාන්‍යාධිකාරී විසින් පත් කර ඇත. තවද එම ලිපියෙන් දින 14 ක් ඇතුළත මූලික විමර්ශණ වාර්තාව නිර්දේශ සහිතව ලබා දීමට නියමකර ඇත. (පිටු අංක 765) (R 1) මූලික විමර්ශණ වාර්තාව සහ නිර්දේශ ලබා දීමට අවුරුදු 02 කට ආසන්න කාලයක් ගත වී ඇත. එනම් 2010.10.13 දින සිද්ධියට අදාළව මූලික විමර්ශණයක්

පැවැත්වීමට කටයුතු කර ඇත්තේ 2012.02.29 වන දිනය. මෙම මූලික විමර්ශණයේ දී ඉල්ලුම්කරුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට විමර්ශණ නිලධාරියා කටයුතු කර නැති බව අධිකරණයේ දී අනාවරණය විය. විමර්ශන නිලධාරියා තම විමර්ශණය සඳහා චූදිත විසින් විගණන අංශයට ලබා දුන් ප්‍රකාශයම උපයෝගි කරගත් බව 2025.03.11 දින අධිකරණයේ දී පළමු පාර්ශ්වයේ හරස් ප්‍රශ්න වලදී පිළිතුරු දී ඇත. (පිටු අංක 10) මණ්ඩලීය විනය සංග්‍රහයේ 13:1. 13:2. 13:6, 13:7, 13:8 වගන්ති වල සඳහන් පරිදි එම උපදෙස් මූලික විමර්ශණ නිලධාරියා විසින් තම විමර්ශණය සඳහා අදාළ කරගෙන නොමැති බව නිරික්ෂණය විය. ඒ අනුව දින 14 කින් ඉල්ලා ඇති වාර්තාව අවුරුදු 02කින් පසු සිදු කිරීම තුළ එම වාර්තාව පිළිබඳ සාක්ෂිමය භාණ්ඩ පිළිබඳ භෞතික ගණනය කිරීම් ආදිය මූලික විමර්ශණ නිලධාරියා විසින්ම වාර්තාවට ඇතුළත් කර නොමැති බව පෙනී යන අතර තමාගේ වාර්තාව සකස් කිරීමට අභ්‍යාන්තර විගණන වාර්තා උපයෝගී කරගත් බැවින් මෙම මූලික විමර්ශණ වාර්තාව ස්වාධීන එකක් වශයෙන් පිළිගත නොහැකි වීමද පෙන්වා දෙමි.

එමෙන්ම “ විනය පරීක්ෂණය අවසානයේ දී ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ විනය සංග්‍රහයේ 21:24 වගන්තිය අනුව විත්තියට ලිඛිත ප්‍රකාශ ලබා දීමට දින 14 ක කාලයක් ලබා දිය යුතු අතර විනිශ්චය සභාව විසින් ඒ බව විධිමත් පරීක්ෂණය අවසානයේ පැමිණිල්ල මෙහෙයවන නිලධාරිට හා විත්ති පක්ෂයට දන්වා සිටිය යුතුය. එමෙන්ම ඉදිපත් කරන ලද ලිඛිත ප්‍රකාශය පරීක්ෂණ වාර්තාවේ කොටසක් ලෙස සලකා එහි ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කළ යුතු වන්නේය. යනුවෙන් සඳහන් වේ. එම අවස්ථාව විනිශ්චය සභාව විසින් ලබා නොදුන් බව මෙම විභාගයේ දී තහවුරු විය.

මෙම විධිමත් පරික්ෂණයේ දී මණ්ඩලයට අදාළ පිත්තල ජල මනු 13 ක් චූදිත සන්තකයේ තිබූ බව සාක්ෂි වලින් තහවුරු කරගත් බව කාර්මික අධිකරණයේ දී කළමණාකරු මානව සම්පත් හා විමර්ශණ එච්.ටී.ටී. වික්‍රමරත්න මහතා ප්‍රකාශ කළද ඉල්ලුම්කරු සන්තකයේ තිබූ බව සනාථ කිරීමට අපොහොසත් වී ඇත. එමෙන්ම මෙම භාණ්ඩ සොරකම් කිරීමට ප්‍රථම කා භාරයේ තිබුණාද යන්න සනාථ කිරීමට අපොහොසත් වී ඇත.

“ 2025.03.11 අධිකරණයේ පළමු පර්ශ්වයේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් කළමනාකරු (මානව සම්පත් හා විනය කටයුතු) වික්‍රමරත්න මහතා ප්‍රකාශ කළේ

ප්‍ර: ඒක හරි. අපිට තිබෙන ගැටළුව ඉල්ලුම්කරු සන්තකයේ තිබ්බාද කියලා?

පි: සන්තකයේ තිබ්බා කියලා පොලිසිය තහවුරු කරලා තියෙනවා.

ප්‍ර: ඇයි අධිකරණයේ දී ඒක තහවුරු කරන්න බැරි වුණේ?

පි: පිළිතුරු නැත. (පිටු අංක 153)

ප්‍ර: විගණන නිලධාරීන්ගේ වාර්තා වලින් පෙනී ගියාද මොහු විසින්ම සොරකම කරා කියලා?

පි: විගණන නිලධාරීන්ගේ වාර්තා වලින් පමණක් එම සොරකම සිදු කළ බව ඊට අමතරව මූලික විමර්ශණයේ දී ලබාගත් සාක්ෂි හා පොලිසිය විසින් ලබා දුන් වාර්තා අනුව තමයි සොරකම සිදු කළ බව තහවුරු වුණේ.

ප්‍ර: පොලිසිය විසින් පවරපු නඩු කටයුත්ත පොලිසියට බැරි වුණා ඔප්පු කර ගන්න.

පි: පොලිසිය අසමත් වෙලා තියෙනවා. (පිටු අංක 22-23)

එමෙන්ම ආයතනික පරික්ෂණයේ දී සොරකම් කළ භාණ්ඩ හදුනා ගැනීමක් හෝ පරීක්ෂණ භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කිරීමට ආයතනය අපොහොසත් වී ඇති අතර පළමු පාර්ශ්වයේ හරස් ප්‍රශ්න වලදී එම නඩු භාණ්ඩ අධිකරණයේ තිබෙන බව පිළිගෙන ඇත. (පිටු අංක 33)

I. විධිමත් විනය පරීක්ෂණයෙන් අවසන් වාර්තාව (R9 පිටු අංක 210) විනය පරීක්ෂණ නිලධාරියාගේ වාර්තාවේ කොටසක් පහතින් උපුටා දක්වමි. “මෙම ජල මනු කොටස් 13 පිළිබඳ බෙදා හැරීම් විස්තර සොයා ගැනීම දුෂ්කර වූ බවත් ජල මනු අංශයේ ගබඩා භාරකරුගේ තොග පොත් වල අදාළ ජල මනු අංක සටහන්ව නොතිබූ බවත්ය. ”

II. ප්‍රධාන ගේට්ටුව ආසන්නයේදීම ජල මනු කොටස් 13 සමඟ චූදිත පොලිස් අත්අඩංගුවට පත් වී ඇති බැවින් මෙම ජල මනු කොටස් මණ්ඩලයට අයත් ඒවා බවට වූ සැකය වැඩිදුරටත් තහවුරු වූ බවයි.

ඉහත සටහන් අනුව අත්අඩංගුවට ගත් ජල මනු කොටස් වල NWSDB යනුවෙන් ජල මනු වල තිබූ පමණින් එය මණ්ඩලයේ ස්වාමිත්වයේ තිබූ බව ඔප්පු කිරීමට අසමත් වී ඇති අතර සැකයක් පමණක් දෙවන පාර්ශ්වයට පදනම් වූ බව පෙනී යයි.

මණ්ඩලය තුළ ජල මනු 335 ඌණතාවයක් තිබූ බව දෙවන පාර්ශ්වය සඳහන් කරන අතර තොග සමීක්ෂණ වාර්තාව අනුව එම 335 හා මෙම ජල අනු කොටස් 13 අතර සම්බන්ධතාවය තහවුරු කිරීමට දෙවන පාර්ශ්වය අපොහොසත් වී ඇත.

මේ බව මෙම සිද්ධියට අදාළ ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 60830 හා 2017.01.11 දරන නඩු තීන්දුවේ සඳහන් වන්නේ "නිලධාරියා විසින් අල්ලා ගත් භාණ්ඩ ජල සම්පාදන මණ්ඩලයට අයත් බව පැවසුවද, ඉතා වැදගත් කාරණයක් වන්නේ භාරකරු කවුරුන්ද යන්න නිශ්චිතව විමර්ශණයේ දී සොයා බලා ඉදිරිපත් කර නැත. එවන් කටයුත්තක් මෙම නිලධාරියා විසින් සිදු කර නැත." යනුවෙන් සඳහන් කර ඇත. (පිටු අංක 65 - R 07)

තවදුරටත් එම නඩු තීන්දුවේ සඳහන් කර ඇත්තේ " නිලධාරීන් පිරිසක් ගොස් කෙනෙක් අල්ලා ගෙන ඔහු භාරයේ තිබූ භාණ්ඩ තමන්ගේ මතය අනුව ජල සම්පත් මණ්ඩලයට අයත් භාණ්ඩ බවට හඳුනා හමුවේ ඉදිරිපත් කර ඇත." යනුවෙනි. (පිටු අංක 65 - R07)

එසේම මෙම නඩු තීන්දුවේ "මෙම නඩුවේ අදාළ භාණ්ඩ වංක සිතින් ඉවත් කළ බවට හෝ යම් කෙනෙකුගේ ස්වාමීත්වයේ තිබූ බවට ද ඔප්පු කරන්නට පැමිණිල්ල අපොහොසත් වී ඇත." එමෙන්ම ජල සම්පාදන මණ්ඩලයට අයත් භාණ්ඩ බවට ඔප්පු කරන්නට පැමිණිල්ල අපොහොසත් වී ඇත යනුවෙන් සඳහන්ව ඇත. (පිටු අංක 65 - R 07)

එමෙන්ම විධිමත් පරීක්ෂණයේ දී ජල මනු අංශයේ ඉංජිනේරු අයි.එම්.ඩබ්. සමරසිංහ මහතා 2013.01.13 වන දින සාක්ෂි ලබා දෙමින් පහත සඳහන් කරුණු සඳහන් කර ඇත. මා ජල මනු කොටස් පරීක්ෂා කර බලා එන්. ඩබ්. බී. එස්.ඩී. බී. අකුරු කොටා තිබූ බැවින් ඒවා මණ්ඩලයට අයත් බව තහවුරු කළා" යනුවෙනි. (පිටු අංක 720)

ප්‍ර: මණ්ඩලයට අයත් ජල මනු අබලි ජල මීනු ලෙස පත් වූ අවස්ථා වලදී මණ්ඩලය විසින් වෙන්දේසියේ විකුණනවාද?

පි: ඔව්. මණ්ඩලයට අයත් භාණ්ඩ වෙන්දේසි කිරීමේ දී සාමාන්‍යයෙන් මණ්ඩලයේ නිළ ලාංඡනය වෙන්දේසි කිරීමට අපේක්ෂා කරන භාණ්ඩ වලින් ඉවත් කොට වෙන්දේසි කල යුතු වනවා. එසේ වුවත් මධ්‍යම ගබඩාවේ අබලි ජල මනු වෙන්දේසි කිරීමේ ක්‍රියාවලිය මා නිරික්ෂණය කළ නොමැති බැවින් අබලි ජල මනු වල ඇති නිල ලාංඡනය ඉවත් කිරීමෙන් පසුව වෙන්දේසි කිරීම සඳහා ඉදිරිපත් කරනවාද යන්න කීමට මට හැකියාවක් නැති බව ප්‍රකාශ කරමි. එමෙන්ම පොලිසිය විසින් මා වෙත පෙන්වා දෙන ලද ජල මනු කොටස් වල අනු අංක අනුවද එම ජල මනු මගේ අංශයට අයත් ජල මනු යැයි මට නිශ්චිතව කිව නොහැක්කේ අප වෙත ජල මනු ලබා දීමේ දී අනුක්‍රමික අංක පිළිබඳ විස්තර අප වෙත ලබා නොදෙන බැවිනි.'' වශයෙනි. (මෙය පැ.07 වශයෙන් සලකුණු කර ඇත. පිටු අංකය 723)

" මගේ අංශයේ සේවක මහතෙකු පොලිස් අත්අඩංගුවට පත් වී ඇති බව මා ඉහළ කළමනාකාරිත්වයට ලිඛිතව දැනුම් දුන් පසු මගේ අංශයේ ගබඩාව සිල් තබා ගබඩා සමීක්ෂණයක් සිදු කළේ නැහැ." යනුවෙන් සාක්ෂි දී තිබේ. (පිටු අංක 723)

මේ අනුව ජල මනු වල අඩු වීමක් තිබේද යන්න පරීක්ෂා කිරීමට අභ්‍යන්තර විගණන අංශය හෝ මූලික විමර්ශණ නිලධාරියා හෝ ඉහළ කළමනාකාරිත්වය කටයුතු කර නොමැති බව පෙනී යයි. මණ්ඩලීය විනය සංග්‍රහයේ දී 13/1, 13/6 පරිදි මූලික විමර්ශණයේ දී කටයුතු කළ යුතු බවට එම වගන්ති වලින් ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කර නොමැති බවට නිගමනය කරමි. මෙම සිද්ධියෙන් පසු ජල මනු අංශයේ තිබූ ජල මනු වල අඩු වීමක් ගැන මා දන්නා තරමින් වාර්තා වූයේ නැහැ.

සිද්ධියට අදාළ ජල මනු වල මනු අංක පරීක්ෂා කිරීමෙන් පසුව එකී ජල මනු පරීක්ෂා කිරීම සඳහා ජල මනු අංශයට එවන ලද ජල මනු නොවන බව අදාළ ලේඛණ පරීක්ෂා කිරීමෙන් පසුව මාගේ ප්‍රකාශය ලබා දීමේ දී විමර්ශණ නිලධාරීට ප්‍රකාශ කළා " යනුවෙන් ජල මනු අංශයේ ඉංජිනේරු (යාන්ත්‍රික) ගොය්‍යාභය අමරසිරි මහතා විධිමත් විනය පරීක්ෂණයේ දී 2013.02.01 විනිශ්චය සභාව ඉදිරියේ සාක්ෂි ලබා දී ඇත.

මේ අනුව ලාංඡනයෙන් ජල සම්පාදන මණ්ඩලයට අයත් ජල මනුයැයි පැවසුවාට එහි ස්වාමීත්වය (භාරකාරත්වය හෝ අයිතිය) දෙවන පාර්ශ්වය විසින් තහවුරු කර නැති බව පෙනී යයි. මූලික විමර්ශණයේ දී සහ අභ්‍යන්තර විගණන වාර්තා අනුව මෙම කරුණු අනාවරණය කර ගැනීමට කටයුතු කර නැති බව තහවුරු වේ.

සාක්ෂිකරු තවදුරටත් සාක්ෂි දෙමින් 2010.10.13 වන දින දීපාල් ප්‍රියන්ත සවස 4.15 ට පමණ ඔහුගේ පුද්ගලික අවශ්‍යතාවයක් සඳහා එනම් රෝගියෙකු බැලීමට රෝහලට යාමට අවශ්‍ය බව මා වෙත වාචිකව දැනුම් දුන්නා. එය මානුෂික අවශ්‍යතාවයක් ලෙස සලකා මා එයට වාචික අනුමැතියක් ලබා දුන්නා. පැ 06 ලේඛණයේ ඇති ප්‍රකාශය නිවැරදි බව පිළිගනිමි." මේ අනුව ඉල්ලුම්කරු ප්‍රියන්ත තමාගේ ආසන්නම අධීක්ෂණ නිලධාරියා දැනුවත් කර කාර්යාලයෙන් බැහැර ගිය බව පෙනී යයි. මෙය අභ්‍යන්තර විගණන වාර්තාවෙන් ද තහවුරු කර ඇත. (R 11 - පිටු අංක 668, 669)

2013.02.11 දින ගබඩා භාරකරු පී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා විධිමත් විනය පරීක්ෂණය සාක්ෂි දෙමින් " මණ්ඩලයේ ජල මනු කොටස් කර මණ්ඩලයේ ජල මනු වෙන්දේසි කිරීමේ දී සිදු කරනු ලැබුවත් මණ්ඩලීය ලාංඡනය ඉවත් කිරීමක් සිදු වන්නේ නැහැ. " ප්‍රකාශ කර ඇත. (පිටු අංක 734)

මේ අනුව ජල සම්පාදන මණ්ඩලය විසින් අබලි ජල මනු වෙන්දේසි කර ඇත්තේ මණ්ඩලීය ලාංඡනය සහිතව බව තහවුරු වන අතර මණ්ඩලීය ලාංඡනය සහිත අබලි ජල මනු මණ්ඩලයෙන් පරිබාහිරව ද තිබිය හැකි බවට නිගමනය කරමි.

එමෙන්ම ජොෂ්ඨ ආරක්ෂක නිලධාරී (හිටපු) පී.ඩී. පනාපගේ මහතා සාක්ෂි දෙමින් ආරක්ෂක බාධක 05 ක් මණ්ඩලය තුළ ස්ථාපිත කර ඇති අතර ප්‍රධාන ගේට්ටුව අසල ඇති ආරක්ෂක නිලධාරීන්ට හෝ දීපාල් ප්‍රියන්ත මහතා ජල මනු කොටස් රැගෙන යාමේ දී අසු වූ බවක් 2010.10.13 වන දින වාර්තා වූයේ නැති බවට සාක්ෂි ලබා දී ඇත. (පිටු අංක 488 - පැ7(1))

විධිමත් විනය පරීක්ෂණයේ දී පො. කො. 67668 ඩී. එන්. ඒ. කුමාරගම මහතා සාක්ෂි දෙමින් චූදිත ප්‍රියන්ත අත්අඩංගුවට ගනු ලැබුවේ ජල සම්පාදන මණ්ඩලයට අයත් භූමියකදී නොව ප්‍රධාන මාර්ගයේ දීය. දීපාල් ප්‍රියන්ත එදින පොලිස් අත්අඩංගුවට ගෙන ඇත්තේ පොල්වත්තේ පිහිටි ජල සම්පාදන මණ්ඩලයට අයත් භූමියෙන් පිටතට පැමිණීමේ දී නොව ඒ අසල පිහිටි කඩයකට ගොස් කඩෙන් පිටතට පැමිණෙන අවස්ථාවේ දී බව සටහන් අනුව මට කිව හැකියි. " යනුවෙන් සාක්ෂි ලබා දී ඇත. (පිටු අංක 744)

මෙම සිද්ධියට අදාළව නඩු අංක 60830 යටතේ ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ දී පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ලබා දෙමින් පොලිස් පරීක්ෂක එන්. එම්.සිල්වා මහතා විසින්, විත්තියේ නීතිඥ දහනායක මහතාගේ හරස් ප්‍රශ්න වලට පහත සඳහන් පිළිතුරු ලබා දී ඇත.

ප්‍ර: 100% පුද්ගලයෙක් ගැන කියලා තියෙද්දිත් බඩු අරගෙන එළියට එනකම්, කඩේට යනකම් හිටියේ මහදී අල්ලා ගත්තේ නැහැ?

පි: මම සාර්ථක අත්අඩංගුවක් කළා.

ප්‍ර: භාණ්ඩ සමඟ පුද්ගලයෙක් අත්අඩංගුවට ගත්තා?

පි: නීතිඥ මහතා එකම දේ අහන්නේ මාව අපහසුතාවයට පත් කරන්න.

ප්‍ර: භාණ්ඩ සමඟ අත්අඩංගුවට ගත්තේ නැද්ද?

පි: ඒ අවස්ථාවේ දී ගත්තේ නැහැ.

මේ අනුව ගම්‍ය වන්නේ චූදිත භාණ්ඩ සමඟ අත්අඩංගුවට නොගත් බවයි. එමෙන්ම " බෑගය දෙවන කඩේ රාක්කයක් යට තිබී ගන්න කියා කිව්වා " යන්න පොලිස් පරීක්ෂක අධිකරණයේ දී පිළිගෙන ඇත. (පිටු අංක 476, 477)

මේ අනුව චූදිත දීපාල් ප්‍රියන්ත අත්අඩංගුවට ගෙන ඇත්තේ ජල සම්පාදන මණ්ඩලයේ ප්‍රධාන ගේට්ටුවෙන් පිට වීමේදී නොව ඒ අසල පිහිටි කඩේට ගොස් ඔහුට අවශ්‍ය භාණ්ඩ මිලදී ගෙන ප්‍රධාන ගේට්ටුවේ ආරක්ෂක නිලධාරියෙකුට රීලෝඩ් කාඩ්පතක් රැගෙන එය ඔහුට දීමට පැමිණි අවස්ථාවේ දී බව චූදිත දීපාල් ප්‍රියන්තගේ ප්‍රකාශ වලින් තහවුරු වේ.

මෙහිදී පැන නගින ප්‍රධානතම ගැටළුවක් වන්නේ 119 ව්‍යාපෘතිය යටතේ ගල්කිස්ස පොලිස් ස්ථානයට ලද තොරතුරක් අනුව ඉහත චූදිත වැටලීමක් ආකාරයෙන් අත්අඩංගුවට ගැනීමට සිවිල් පොලිස් නිලධාරීන් කණ්ඩායමක් සමඟ සූදානම්ව සිටි ගල්කිස්ස පොලිසියේ අදාළ පොලිස් පරීක්ෂක චූදිත ප්‍රධාන ගේට්ටුවෙන් එළියට එන අවස්ථාවේ ඔහු ප්‍රධාන ගේට්ටුවෙන් පිටවන බව දැන දැනම ඔහු අත්අඩංගුවට නොගත්තේ මන්ද යන්නයි. (පිටු අංක 463)

(මානව සම්පත් හා විමර්ශන) කළමනාකරු එච්.වී.ටී. වික්‍රමරත්න මහතා විධිමත් පරීක්ෂණයේ දී සාක්ෂි ලබා දෙමින් ජල මනු යන්ත්‍රාගාරයේ ජල මනු අලුත්වැඩියා කරන්නෙකු වන දීපාල් ප්‍රියන්ත මහතා වෙත අලුත්වැඩියා කිරීමට ලැබෙන අබලි ජල මනු අලුත්වැඩියා කිරීම මිස සේවා ස්ථානයෙන් පිටතට ඒවා රැගෙන යනු ඇතැයි කිසිවිටෙකත් මණ්ඩලය විශ්වාස කරන්නේ නැත. ඔහු වගකීමෙන් යුක්තව එම අබලි ජල මනු අලුත්වැඩියාවන් සිදුකරනු ඇති බවට මණ්ඩලය ඔහු කෙරෙහි තබා ඇති විශ්වාසයයි. නමුත් ඔහු 2010.10.13 දින අනවසරෙන් ජල මනු කොටස් 13 රැගෙන යාමට කටයුතු කිරීමෙන් සිදුකර ඇත්තේ මණ්ඩලය ඔහු කෙරෙහි තබා ඇති විශ්වාසය පලුදු කිරීම යනුවෙන් සාක්ෂි ලබා දී ඇත. ඔහු ඉහත සාක්ෂි තමා අනාවරණය කරගත් කරුණු මත නොපිහිටා උපකල්පනය මත සාක්ෂි ලබා දී ඇති බව පෙනී යන අතර ඒකපුද්ගල විනිශ්චය සභාවේ නිගමනයන්ට ද මෙම උපකල්පනය බලපා ඇති බව පෙනී යයි. (පිටු අංක 750) මේ පිළිබඳව චූදිතගේ රැකවරණ නිලධාරියාද පරීක්ෂණයේදී ප්‍රශ්න කර ඇත.

මෙම විධිමත් විනය පරීක්ෂණයේ දී පැවැත් වූ ඒකපුද්ගල විනිශ්චය සභාව 2013.02.22 දින තම අවසන් වාර්තාවේ 7 වන ඡේදය යටතේ අවසාන ඡේදයේ සඳහන් කර ඇත්තේ " චූදිත වරදකරු බවට නිගමනය කරනු ලැබ ඇති චෝදනා එතරම් බරපතල නොවන බව විනිශ්චය සභාවේ මතය බවයි. ඒ අනුව වැටුප් වර්ධක දෙකක් විලම්භනය කිරීම සුදුසු බව විනිශ්චය සභාවේ අදහස බවට සඳහන් කර ඇත. (පිටු අංක 213)

මණ්ඩලයේ විනය සංග්‍රහයේ 22(6) යටතේ විනය බලධාරයාට ලැබී ඇති බලය මත දඬුවම් උපරිමයෙන් ලබා දීමට කටයුතු කළ හැකි අතර එසේ කටයුතු කර ඇති බව පෙනී යයි. විනය සංග්‍රහයේ 22(7) වගන්තියෙන් ඊට හේතු සාධක විනය බලධරයා විසින් අදාළ විනය

ගොනුවේ පැහැදිලිව නිශ්චිතව සටහන් කර තැබිය යුත්තේය යනුවෙන් සඳහන් වුවත් එසේ කටයුතු කළ බවට විනය බලධරයා යෙදූ සටහන් කාර්මික අධිකරණයට දෙවන පාර්ශ්වය ඉදිරිපත් නොකළ බව සඳහන් කරමි.

මෙම චූදිතයාගේ පෙර සේවා කාලය සලකන විට වසර 22 ක් පමණ ජල සම්පත් මණ්ඩලයේ සේවය කර ඇති අතර ජලප්‍රවාහන මණ්ඩලයට යම් කීර්තියක් ලබා දීමට කටයුතු කළ අයෙකු බව 2008 දෙසැම්බර් මාසයේ ජලය කලාපයේ 6 වෙනි පිටුව සාක්ෂිකරුට පළමු පාර්ශ්වය අධිකරණයේ දී පෙන්වා සිටී. එසේම වාත, කපාට නිර්මාණය කිරීම සම්බන්ධයෙන් පේටන්ට් බලපත්‍රයක් ද ඉල්ලුම්කරු ලබා ගෙන ඇති බව සනාථ වේ. (පිටු අංක 157,158) විනිශ්චය සභාවේ 7 වන ඡේදයේ සඳහන් කළ පරිදි චූදිතට විරුද්ධව නගන ලද චෝදනා බරපතල නොවන බව සඳහන් කර ඇති බැවින් එම චෝදනා සඳහා බරපතල ගණයේ වැරදිවලට අදාළ විනය සංග්‍රහයේ 24:36, 24:3.1. 24 යටතේ බරපතල දඬුවම් 03 ක් ලබා දී සුළු දැඬුවමක් 24:2.2 යටතේ ලබා දී ඇත. සාමාන්‍යාධිකාරීවරයා විනය බලධාරයා වශයෙන් චූදිතට දඬුවම් කර ඇත. මෙම විනය නියෝගය හා විනිශ්චය සභාව පළ කළ අවසාන මතය සැළකිල්ලට නොගෙන සාමාන්‍යාධිකාරිවරයා ඊට හේතු සඳහන් නොකර විනය බලධාරීයා වශයෙන් තමාට ලැබී ඇති බලය මතම කටයුතු කර ඇති අතර ඉල්ලුම්කරුට සාධාරණය හා යුක්තිය ඉටු නොවූ අතර අසාධාරණයක් සිදු කර ඇති බවට නිශ්චය කර නිගමනය කරයි.

මේ අනුව අයි. ඒ. දීපාල් ප්‍රියන්ත මහතාට 2013.09.30 දාතමින් පනවනු ලැබූ විනය දඬුවම් මගින් අසාධාරණයක් සිදු වී ඇති බැවින් ඉල්ලුම්කරු වන ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයේ මාපක අලුත්වැඩියාකරුවෙකු වශයෙන් සේවය කළ අයි. ඒ. දීපාල් ප්‍රියන්ත මහතා 2010.10.13 සිට ඔහු එදිනට දැරූ තනතුරේ පිහිටවිය යුතු බවට නිශ්චය කොට එසේ කළ යුතු බවට සාමාන්‍යාධිකාරීවරයාට නියම කරමි.

ඉල්ලුම්කරුට 2010.10.13 සිට ලැබිය යුතු සියළුම වැටුප් සහ අත්හිට වූ වැටුප් අනෙකුත් සියලුම දීමනා හිමි බවට ද නිශ්චය කර නිගමනය කරමි.

ඉල්ලුම්කරු වන අයි. ඒ. දීපාල් ප්‍රියන්ත මහතාට විරුද්ධව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය මගින් ඔහුට විරුද්ධව නගන ලද චෝදනා සාධාරණ හා සැකයෙන් තොරව ඔප්පු කිරීමට ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය අපොහොසත් වී ඇති බවට නිගමනය කරමි.

දොපාර්ශ්වයේම මෙම බේරුම්කරණයට අදාළව කාර්මික අධිකරණයේ සලකුණු කරන ලද සියළුම ලේඛන හා සාක්ෂි, ලිඛිත දේශන මැනවින් අධ්‍යනය කළ බවට සහතික කරමි. තවද මෙම සිද්ධිය සිදු වී අවුරුදු 15 ක් පමණ කල්ගත වී තිබීමත් රාජ්‍ය වියදම අවම කරගත යුතු කාල වකවානුවක මෙම බේරුම්කරණය මාස 03 කට ආසන්න කාලයක් තුළ අවසන් කිරීමට සහ ප්‍රදානය ලබා දීමට හැකි සෑම පියවරක්ම ගන්නා ලද බවද වැඩිදුරටත් සඳහන් කරමි.

**ප්‍රදානය**

ඉහත කාරණා හේතුවෙන් කාර්මික නීතියේ ඉහළින්ම පිළිගැනෙන යුක්ති සහගත සහ සාධාරණ නිගමනයක් වශයෙන් ඉල්ලුම්කරු වන අයි. ඒ. දීපාල් ප්‍රියන්ත මහතාට විනය නියෝගය මගින් ලබා දී ඇති දඬුවම්වලින් අසාධාරණයක් සිදු වී ඇති බැවින් ඉල්ලුම්කරු 2010.10.13 දින සිට ඔහු සේවය කළ තනතුරේ නැවත ස්ථාපිත කිරීමට ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි වරයාට මෙයින් නියෝග කර නියම කරමි. එමෙන්ම එදින සිට ඔහුට ලැබිය යුතු හිමි වැටුප සහ අනෙකුත් දීමනා වරප්‍රසාද හිමි වන බව සඳහන් කරමි.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළ වී මසක් ඇතුළත මේ පිළිබඳව ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා අවශ්‍ය කටයුතු කර එසේ කළ බවට ලිඛිත දැනුම් දීමක් දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත දැනුම් දීමට කටයුතු කළ යුතු බවටද නියම කර නියෝග කරමි.

ඒ.බී. හේරත්,
බේරුම්කරු.

බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණය
2025 ජූලි මස 03 වැනි දින.

EOG 08-0126

මගේ අංකය: IR/COM/02/2018/127.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.06.03 දිනැති හා අංක 2439/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.05.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහනුවර, හීරස්සගල, රිච්මන්ඩ් හිල් ලේන්, නො. 145/4 හි පදිංචි ලංකා කම්කරු රතු කොඩි සංගමය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් 1. කොළඹ 12, මිරානියා වීදිය, බී.සී.සී. පරිශ්‍රය, නො. 21 හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 2. හුන්නස්ගිරිය, හෙයාර් පාර්ක් වත්ත හි වතු අධිකාරි අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/37/2025 හා 2025.07.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.එම්.ඩී.එන්.කේ.වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූලි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව.**

**බේරුම්කරු ඔබඩගේ ලීලාරත්න මැතිතුමන් ඉදිරියේදීය.**

ලංකා කම්කරු රතු කොඩි සංගමය,
නො. 145/4,
රිච්මන්ඩ් හිල් ලේන්,
හීරස්සගල, මහනුවර.

*පළමු පාර්ශ්වය*

ආරාවුල් අංකය : IR/COM/02/2018/127
බේරුම්කරණ අංකය : A/37/2025

සහ

1. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,
නො.21. බී. සී. සී. පරිශ්‍රය,
මිරානියා වීදිය,
කොළඹ 12.

2. වතු අධිකාරී,
හෙයාර් පාර්ක් වත්ත,
හුන්නස්ගිරිය.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත දැක්වෙන කාර්මික ආරාවුලට හේතු පාදක වී ඇත්තේ,

" ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හුන්නස්ගිරිය හෙයාර් පාර්ක් වත්තේ සේවකයින්ට සාමූහික ගිවිසුම අනුව 2007 සිට 2019 දක්වා මසකට අවම වශයෙන් දින 25 ක් හෝ සේවය කිරීමට අවස්ථාව ලබා නොදීමෙන් එම සේවකයන්ට අසාධාරණයක් සිදුව තිබේද? අසාධාරණයක් සිදුව ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ"

මෙම ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මීට ප්‍රථම බේරුම්කරණ ගොනු අංක A/24/2020 යටතේ බේරුම්කරු එල්.ආර්. සුමතිපාල මහතා වෙත යොමු කර ඇති අතර, පසුව එල්.ආර්.සුමතිපාල මහතා අදාළ බේරුම්කරණ නඩුවෙන් ඉල්ලා අස්වීම මත පසුව බේරුම්කරු අමරනාත් පෙරේරා රාජකරුණා මහතා වෙත බේරුම්කරණ නඩු අංක A/61/2021 යටතේ යොමු කොට ඇත. ඉන් අනතුරුව බේරුම්කරු විසින් අදාළ බේරුම්කරණ නඩුව විමර්ශණයට භාජනය කර ඇති අතර, දෙපාර්ශ්වයේම සාක්ෂි වසර තුනකට පමණ ආසන්න කාලයක් මෙහෙය වීමෙන් අනතුරුව අවසාන ලිඛිත දේශණ ලබාදීමට කටයුතු කරන ලෙස දැන්වීමෙන් අනතුරුව දෙපාර්ශ්වය විසින්ම සිය ලිඛිත දේශණ ද ගොනු කර ඇත. ලිඛිත දේශණ ද බාරදීමෙන් අනතුරුව බේරුම්කරණ ප්‍රදානය ලබාදීම සඳහා අදාළ නඩු ගොනුව බේරුම්කරු වෙත භාර දුන් පසුව, 2025 මාර්තු මස 11 දාතම දරන ලිපිය මගින් ඔහුට හෘදයාබාධයක් ඇති වූ බවට පවසා මෙම බේරුම් කරණ නඩුවෙන් ඉවත් වී ඇත.

ඉන් අනතුරුව ගරු කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් මෙම ආරාවුල නැවත වරක් 2025 මැයි මස 26 දාතමින් යුතුව මා වෙත යොමු කොට තිබුණි. අදාළ ගොනුවට අනුව බේරුම්කරණ නඩු අංකය වනුයේ A/37/2025 වේ. මා විසින් අනතුරුව දෙපාර්ශ්වයම කැඳවීමෙන් අනතුරුව මෙම බේරුම්කරණ නඩුව මීට කලින් අවස්ථාවේදී අවසන් වූ අදියරෙන් ඉදිරියට ගෙනයාමටත් A/61/2021 දරන නඩුවේ මෙහෙය වූ සාක්ෂි සහ ඉදිරිපත් කරන ලද ලේඛන හා දෙපාර්ශ්වයේ අවසාන ලිඛිත දේශණ මත පදනම්ව ප්‍රදානයක් ලබාදීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් විරෝධතාවයක් ඇත්දැයි දෙපාර්ශ්වයෙන්ම විමසූ අතර, දෙපාර්ශ්වය විසින්ම කලින් පැවති බේරුම්කරණ නඩුවේ සියළු සාක්ෂි සහ ලේඛන මෙන්ම ලිඛිත සැලකිරීම් ද පදනම් කර ගනිමින් ප්‍රදානයක් ලබාදීම සම්බන්ධයෙන් විරෝධතාවයක් නොමැති බව පැවසීමෙන් අනතුරුව අදාළ A/61/2021 දරන ගොනුවේ ඇති සියළුම සාක්ෂි මෙන්ම සලකුණු කරන ලද සියළුම ලේඛන මෙන්ම දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද පළමු හා දෙවැනි ප්‍රකාශ පදනම් කරගෙන අදාළ ප්‍රදානය ලබාදීමට කටයුතු කිරීමට තීරණය කළෙමි.

**පසුබිම**

මෙම ආරාවුල හටගෙන ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ පාලනය වන මධ්‍යම පළාතේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වන හුන්නස්ගිරිය නගරයට මායිම්ව මීමුරේ දක්වා දිවෙන අසල පිහිටි හෙයාර් පාර්ක් රාජ්‍ය වතුයායේ වන අතර, එම වතු යාය ආසන්න වශයෙන් හෙක්ටර් යාර 975.75 ක භූමි භාගයක පිහිටා ඇත.

අදාළ ආරාවුල ඇතිවී ඇති හෙයාර් පාර්ක් වත්තේ ඩිවිෂන් 6 ක් ඇත. එනම්,

1. දෙහිගොල්ල ඩිවිෂන්,
2. කොබෝ නීල ඩිවිෂන්,
3. හෙයර් පාර්ක් ඩිවිෂන්,
4. නවනගල ඩිවිෂන්,
5. නුගගල ඩිවිෂන් ;සහ
6. කන්දේවත්ත ඩිවිෂන් වශයෙනි.

මෙම ආරාවුලට පාදක වී ඇත්තේ වෘත්තීය සමිතිය විසින් පවසන පරිදි 2003.07.24 දිනැති සාමූහික ගිවිසුමේ 8 ඡේදයට අනුව මසකට දින 25 ක නැත්නම් වසරකට දින 300 ක් සේවකයන්ට සේවායෝජක විසින් වැඩ ලබානොදීම වන අතර, මේ සම්බන්ධයෙන් බොහෝ සාකච්ඡාවන් විවිධ පාර්ශ්වයන් සමග සිදුකර ඇති අතර, ඒ කිසිදු සාකච්ඡාවකින් කිසිදු ප්‍රතිඵලයක් ලැබී නොමැති අතර, අවසානයේ දී කාර්මික සම්බන්ධතා අංශයෙන් මෙම ආරාවුල නිරවුල් කිරීම සඳහා බේරුම්කරණයට යොමුකොට ඇත.

පැමිණිලිකාර වෘත්තීය සමිතිය, වෙනම නෛතික ඒකකයක් ලෙසට කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර් වෙතින් ලියාපදිංචි සහතිකයක් ලබා ක්‍රියාත්මක වන ආයතනයක් වේ. අදාළ ලියාපදිංචි සහතිකයට අනුව මෙය ස්වාධීන වෘත්තීය සමිතියක් බව පැහැදිලි වේ. එහෙත් වෘත්තීය සමිතිය පවසන ආකාරයට තම වෘත්තීය සමිතිය Joint Plantation Trade Union Center හි සාමාජිකයෙක් වේ. මෙම තත්ත්වය සනාථ කිරීමට කිසිදු ලිඛිත සාක්ෂියක් වෘත්තීය සමිතිය මගින් ඉදිරිපත් කර නොමැත.

පළමු පාර්ශ්වය වන වෘත්තීය සමිතියේ 2020.08.04 දිනැති ලිඛිත දේශණවලට අනුව ගොනුවේ (A/24/2020) පිටු අංක 13 හි ඇති 18 ඡේදයට අනුව මෙම ආරාවුල පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව සමග පරීක්ෂණ කටයුතුවලට සම්බන්ධ වී ඇත. ඒ අනුව 2009 සිට සාකච්ඡා ගණනාවක් කම්කරු දෙපාර්තමේන්තුවේ පවත්වා ඇති අතර, නුවර උතුර කම්කරු කාර්යාලයේ පැවැත්වූ සාකච්ඡා 14 න් 13 ක් සඳහාම රාජ්‍ය වැවිලි සංස්ථාව සහභාගී වී නොමැති බවද දක්වා ඇත.

අනතුරුව කම්කරු කොමසාරිස් විසින් වෙන් වෙන්ව පරීක්ෂණ තුනක් යටතේ මෙම ආරාවුල පිළිබඳව සාකච්ඡා පවත්වා ඇතත් ඒවායේ ද කිසිදු ප්‍රතිඵලයක් ඇති වී ඇති බවක් නොපෙනේ. ඒ අතර තුර 2010 අගෝස්තු මස 05 වැනි දින රාජ්‍ය සම්පත් හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යවරයා සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා ඇතත් ඒ සම්බන්ධයෙන්ද කිසිදු ප්‍රතිඵලයක් ලැබී නොමැති බව පෙනී යයි.

නැවතත්, 2012 ඔක්තෝබර් මස 01 දාතමින් කම්කරු කොමසාරිස් වෙත වෘත්තීය සමිතිය මගින් මෙම ආරාවුල පිළිබඳව දන්වා ඇතත්, රාජ්‍ය වැවිලි සංස්ථාව අදාළ ආරාවුල සම්බන්ධයෙන් ප්‍රතිචාරයක් දක්වා නොමැති බැවින් කම්කරු කොමසාරිස්වරයා විසින් නැවතත් එම ආරාවුල මහනුවර උතුර කම්කරු කාර්යාලය වෙත යොමු කොට ඇත. ඉන් පසුව ද මහනුවර උතුර කම්කරු කාර්යාලය මගින් මේ සම්බන්ධයෙන් සාකච්ඡා වට කිහිපයක්ම පවත්වා ඇති බව ද අනාවරණය වේ.

අනතුරුව වෘත්තීය සමිතිය මගින් කම්කරු අමාත්‍යවරයාගෙන් සාකච්ඡාවක් ඉල්ලා ඇතත් එම උත්සාහය සාර්ථක වී නොමැති බවට කරුණු දක්වා ඇත. මීට අමතරව වෘත්තීය සමිතිය විසින්

රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ද මෙම ආරාවුල සම්බන්ධයෙන් සාකච්ඡා ඉල්ලා අවස්ථා ගණනාවකදීම ඉල්ලීම් සිදුකර ඇතත් ඒ කිසිදු උත්සාහයක් සාර්ථක වී නොමැති බවද නිරීක්ෂණය වේ.

2017 සැප්තැම්බර් 27 හෝ ආසන්න දිනකදී කම්කරු කොමසාරිස්වරයා හා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වරයා සමග පැවති සාකච්ඡාවේදී එළැඹි එකඟතාවයන් ද ප්‍රතිඵලදායී වි නොමැති බව පෙනී යයි. කෙසේ වුවත් මේ සම්බන්ධයෙන් උද්ඝෝෂණයක් ද කම්කරු දෙපාර්තමේන්තුව අභියසදී පැවති බවත්, වැඩ වර්ජනයක් පැවති බවත් අනාවරණය වේ.

කෙසේ වුවද දිගු කාලයක් සාකච්ඡා පවත්වමින් මෙම ආරාවුල නිරවුල් කර ගැනීම සඳහා උත්සාහ දරා ඇති අතර, තමන්ට දින 25 සේවය ලබාදිය නොහැකිනම් 2009 සිට 2017 දක්වා කාලය වෙනුවෙන් වන්දි මුදලක් ලබාදෙන ලෙස ඉල්ලා ඇති අතර, එසේ නොමැති නම් තේ අක්කර 2 බැගින් අදාළ සේවකයන් වෙත සින්නක්කරයේ ලබාදෙන ලෙස ද ඉල්ලීම් කර ඇත. මෙවැනි පසුබිමක් තුළ ආරාවුල කිසිදු පාර්ශ්වයක් විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ග මගින් විසඳී නොමැති අතර, අවසානයේ මෙම ආරාවුල බේරුම්කරණයෙන් විසඳගැනීම සඳහා බේරුම්කරණයට යොමුකොට ඇති බව පැහැදිලි වේ.

වෘත්තීය සමිතිය සිය පළමු සහ දෙවැනි ප්‍රකාශවලින් මෙන්ම අවසාන ලිඛිත සැලකිරීම් වලින්ද දිගින් දිගටම කරුණු දක්වා ඇත්තේ තම වෘත්තීය සමිති සාමාජිකයන් වෙත වර්ෂ 2009 සිට දිගින් දිගටම මසකට දින 25 ක වැඩ ලබා නොදුන් බවත්, මේ හේතුව මත තම සාමාජිකයන් දැඩි ආර්ථික, සමාජීය මෙන්ම මානසික ගැටළුවලට මුහුණ දුන් බවත්, ඉතා සුළු වැටුපක් ලැබීම හේතුවෙන් දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ පෑ බවත්, මේ හේතුව මත දරුවන්ගේ අධ්‍යාපනය කඩා කප්පල් වූ බවත්, ලෙඩ රෝග වැළඳීම නිසා දැඩි අපහසුතාවයකට පත්වූ බවත් පවසා සිටී. එමෙන්ම රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හෙයාර්පාර්ක් වත්තේ සේවකයන්ට මසකට දින 25 වැඩ නොදීමෙන් සිදුකරන ලද අසාධාරණයට ප්‍රධාන වශයෙන් රාජ්‍ය වැවිලි සංස්ථාව වගකිව යුතු බවත්, වත්ත නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා වත්තේ තේ දළු ප්‍රමාණය ඉතා පහත් මට්ටමක පැවතීමේ හේතුවෙන් හා නිසි කලට  පොහොර නොයෙදීම නිසා දළු ආදායම් පහල ගොස් ඇති බව ද අවධාරණය කර ඇත.

රාජ්‍ය වැවිලි සංස්ථාව මේ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙමින්, තමන් මෙම සාමූහික ගිවිසුමෙහි කොටස්කරුවන් නොවන බවත්, තමා ඒ අනුව සාමූහික ගිවිසුමේ ප්‍රතිපාදන අනුව කටයුතු කිරීමට බැඳී නොමැති බවත්, මෙය රාජ්‍ය වතුයායක් බවත්, මෙම හෙයාර් පාර්ක් වත්තෙහි ඇති තේ වගාව වසර 100 කට වඩා පැරණි තේ වගාවක් බවත්, එම ප්‍රදේශයේ ඇති කාලගුණික සාධක හේතුවෙන් තේ වගාව නිසි පරිදි පවත්වා ගෙන යාමට නොහැකි බවත්, තේ පර්යේෂණ ආයතනයෙන් පවා උපදෙස් දී ඇත්තේ මෙම බිම තේ වගා කිරීමට සුදුසු නොවන බවත් බව පවසා සිටී. අධික වර්ෂාව, අධික සුළඟ (සුලං කපොල්ලක් මෙන්), තේ දළු කුණුවීම ආදී හේතු මතත්,  රාජ්‍ය වැවිලි සංස්ථාව පාඩු ලබමින් සිටින බවත්, බොහෝ විට රජයේ මුදල් මත යැපෙන බවත්, එහෙත් දිගින් දිගටම රජය විසින් ප්‍රතිපාදන ලබා නොදෙන බවත්, දිගු කාලයක් සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තීන්ගේ භාර අරමුදල් ගෙවා නොමැති බවත්, ඒ හේතුව මත කම්කරු දෙපාර්තමේන්තුව හා සේවා නියුක්තීන්ගේ භාර අරමුදල ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතර, දැනට අධ්‍යක්ෂ මණ්ඩලයට වරෙන්තු නිකුත් වී ඇති බව ද දක්වා ඇත. තවද, තමන් හැකි උපරිමයෙන් සේවකයන්ට වැඩ ලබාදී ඇති බවත්, වෘත්තීය සමිතිය දක්වන පරිදි එය දින 5-10ත් අතර ප්‍රමාණයක් නොව දින 15. 20,22 අතර ප්‍රමාණයක් බවටත් කරුණු දක්වා ඇත.

**සාක්ෂි විශ්ලෙෂණය**

සාක්ෂි විමසීමේදී විශේෂයෙන්ම සොයා බැලිය යුත්තේ ඇත්ත වශයෙන්ම මෙම සාමූහික ගිවිසුමෙහි රාජ්‍ය වැවිලි සංස්ථාව පාර්ශ්ව කරුවෙක් ද, එසේත් නොමැති නම් සෑම වත්තක් සඳහාම අදාළ සාමූහික ගිවිසුමේ බලපෑම ගරු කම්කරු අමාත්‍යවරයා විසින් ඔහුට

පනතින් පැවරී ඇති බලතල අනුව ව්‍යාප්තකොට ඇත්ද, එසේත් නොමැති නම් රාජ්‍ය වැවිලි සංස්ථාව මෙම සාමූහික ගිවිසුම අනුව කටයුතු කරමින් පැවතියේ ද යන්න පිළිබඳවයි. මේ සම්බන්ධයෙන් දෙපාර්ශ්වයෙන් ඉදිරිපත් වූ සාක්ෂි පිළිබඳව සලකා බැලීමට මත්තෙන්, පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කොට ඇති A 87 වන 2003 අංක 13 දරන සාමූහික ගිවිසුම සහ එහි බලාත්මක භාවය සම්බන්ධයෙන් සලකා බැලිය යුතු වේ. ඒ අනුව මෙම සාමූහික ගිවිසුම හාම්පුතුන්ගේ සම්මේලනය (Employers’ Federation of Ceylon) සහ ලංකා කම්කරු කොංග්‍රසය (Ceylon Worker’ Congress), ලංකා ජාතික වතුකම්කරු සමිතිය(Lanka Jathika Estate Workers’ Union) සහ ඒකාබද්ධ වතු වෘත්තීය සමිති මධ්‍යස්ථානය (Joint Plantation trade Union Centre) අතර අත්සන් තබන ලද සාමූහික ගිවිසුමකි.

මෙම ගිවිසුමේ උපලේඛනය 1 මගින් මෙම ගිවිසුමෙන් ආවරණය වන සේවායෝජකයින්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කර ඇත. එනම්,

1. Agalawatte Plantations Ltd
2. Agarapatana Plantations Ltd
3. Balangoda Plantations Ltd
4. Bogawanthalawa Plantations Ltd
5. Elpitiya Plantations Ltd
6. Hapugastenne Plantations Ltd
7. Horana Plantations Ltd
8. Kahawatte Plantations Ltd
9. Kegalle Plantations Ltd
10. Kelani Valley Plantations Ltd
11. Kotagala Plantations Ltd
12. Madulsima Plantations Ltd
13. Malwatte Valley Plantations Ltd
14. Maskeliya Plantations Ltd
15. Maturata Plantations Ltd
16. Namunukula Plantations Ltd
17. Pussellawa Plantations Ltd
18. Talawakelle Plantations Ltd
19. Udupussellawa Plantations Ltd
20. Watawala Plantations Ltd

In section 8 of the said collective agreement as follows,
“8. Number of Days Work Offered and Wage Advances
(i) An Employer shall offer 300 days work in a year including annual leave, statutory holidays and 10 days in lieu of and

bonus except in situations contemplated in (ix) below. The Offer of work shall include all days on which work is avail an employee whether or not he/she works or offers himself/herself for work.

(ii) An employer shall subject to (i) above, offer 25 days work in a month, to all employees other than sundry employe would nevertheless be entitled to the offer of 300 days work per annum as set out at (i) above".

සාමූහික ගිවිසුමට ප්‍රකාරව එම ගිවිසුමෙන් බැඳී පවතින පාර්ශ්වයන් එකී ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතු අතර, එසේ කටයුතු නොකරන්නේ නම් ගිවිසුමේ කොන්දේසි උල්ලංඝණය මත කම්කරු දෙපාර්තමේන්තුවට අදාල පාර්ශ්වයන්ට එරෙහිව නඩු පැවරිය හැකිය.

මෙම ආරාවුල සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ විවිධ අංශවලට මෙන්ම කම්කරු කොමසාරිස් ජනරාල්තුමා වෙත දක්වාම පැමිණිලි යොමු කොට ඇති බවත්, ඒ කිසිදු පැමිණිල්ලක් විමර්ශනය අවසානයේ අවසාන නිගමනයකට පැමිණ නොමැති බවත් නිරීක්ෂණය වේ. එසේ සටහන් කිරීමට හේතු පාදක වූයේ 2016-10-05 දින කම්කරු කොමසාරිස් ජනරාල් එම්. ඩී. චාන්දනී අමරතුංග මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමට අදාල සාකච්ඡා සටහන් වල අඩංගු කරුණු මත වේ. මෙම සාකච්ඡා සටහන් A 48 ලෙස පැමිණිල්ල විසින් සලකුණු කොට ඇත. මෙම සාකච්ඡාවට කම්කරු කොමසාරිස් ජනරාල්තුමිය, ජ්‍යෙෂ්ඨ නීති උපදේශක (නීති ක්‍රියා) පී. එස්. පතිරන, කම්කරු කොමසාරිස් ( විශේෂ විමර්ශන අංශය) පී.ඩබ්. එම්. ජී. වික්‍රමසිංහ, නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) කේ. ඩබ්. ඇලපාත යන අය සහභාගී වී ඇත. ඊට අමතරව, ලංකා රතු කොඩි සංගමය වෙනුවෙන් නිලධාරීන් ඇතුලු 7 දෙනෙක් ද,

මීට අමතරව,

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඒ. ලක්කදාස් මහතාද,<br>
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සාමාන්‍යාධිකාරී අයි. ඩබ්. ආර්. ජයවර්ධන මහතාද,<br>
ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ නීති කළමනාකරු එරන්දෙ කන්දෙගම මහතාද,<br>
ඇල්කඩුව වැවිලි සමාගමේ සාමාන්‍යාධිකාරී එස්.කේ. නවරත්න මහතා ද සහභාගී වී ඇත.

මෙම සාකච්ඡා සටහන් අතර,

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සඳහන් කර ඇත්තේ අදාළ වතු දීර්ඝ කාලයක් තිස්සේ පරිහානියට පත්වීම ඇතිව තිබූ බවත්, ඒ නිසාම ඒවායේ සේවය කරන සේවකයින් හට වැටුප් ගෙවීමේ ගැටළුවක් ද ඇතිවී තිබූ බවත්ය. වැටුප් ගෙවීම අසීරු වුවද මහා භාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රදානයන් ලබාගෙන වැටුප් ගෙවීම් කරගෙන ගිය බවත් සඳහන් කර ඇත.

තවද, මෙම සාකච්ඡාවේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් සහභාගී වූ නිලධාරී මහතා සඳහන් කර ඇත්තේ, පොහොර නොදැමීම වතුවල කඩා වැටීමට හේතුවක් නොවන බවත්, 2008 වර්ෂයේ දී වරින් වර මිලියන 50 ක පමණ පොහොර යොදා ඇති නමුත් හොඳ නිෂ්පාදනයක් ලබා ගැනීමට නොහැකි වීම මත එසේ යෙදවූ මුදල් අපතේ යාමක් සිදුවූ බවත්ය. මීට අමතරව, පවසා ඇති කරුණු අතර, පසුගිය වසරේ පමණක් මිලියන 400 කට වඩා පාඩු ලබා ඇති බවත්, සේවක අර්ථ සාධක අරමුදල් මිලියන 880 කට ආසන්න ප්‍රමාණයක් ගෙවා නොමැති බවත් සඳහන් කර ඇත.

ලංකා කම්කරු රතු කොඩි සංගමයේ ප්‍රධාන ලේකම් මේනකා කන්දසාමි මෙනෙවිය පවසා ඇත්තේ ප්‍රධාන වශයෙන් තමන් ගැටළු තුනක් ඉදිරිපත් කරන බවත්, ඒවා නම්

1. සාමූහික ගිවිසුම අත්සන් කිරීම දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රමාද වී පවතින බවත්,

2. රජයේ වතු සමාගම්වල සේවකයන්ට වැඩ ලබා දෙනුයේ දින 05, 09 ක් අතර ප්‍රමාණයක් බවත්, දෛනික වැටුප වශයෙන් ලබාදෙනුයේ රු 450 ක මුදලක් පමණක් බවත්,

3. වෘත්තීය සමිති මර්ධනය සඳහා වැවිලි ක්ෂේත්‍රයේ ඉහළ බලපෑමක් ඇති බවත් දක්වා ඇත.

මෙම සාකච්ඡා සටහන්වල වැදගත්ම අංගය වනුයේ කම්කරු කොමසාරිස් ජනරාල්වරියගේ අවසාන සටහනයි. එනම් එකී සාකච්ඡාවක සටහන් අනුව කම්කරු කොමසාරිස් ජනරාල්වරිය මෙසේ කරුණු සටහන් කර ඇත.

" අවසාන වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්තුමිය සඳහන් කර සිටියේ තවදුරටත් මේ සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව තුල සාකච්ඡා කිරීම නුසුදුසු බැවින් මෙම ගැටළුව අදාල වන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා සමඟ සාකච්ඡාවක් පැවැත්වීම සුදුසු බවයි."

ඉහත කරුණු අනුව පැහැදිලිවම පෙනී යන්නේ කම්කරු දෙපාර්තමේන්තුව මගින් දිගින් දිගටම පැවැත් වූ සාකච්ඡා වලදී කිසිදු අවසාන නිගමනයකට පැමිණීමට අසමත් වී ඇති බවත්, වෘත්තීය සමිතිය අපේක්ෂා කරන ලද කිසිදු අපේක්ෂාවක් එම සාකච්ඡා මගින් ඉටු වී නොමැති බවත් වේ.

මෙම කිසිදු සාකච්ඡාවක දී අදාල සාමූහික ගිවිසුම මෙම වෘත්තීය සමිතිය කෙරෙහි බලාත්මක වේද, රාජ්‍ය වැවිලි සංස්ථාව හෝ ජනතා වතු සංවර්ධන මණ්ඩලය මෙම සාමූහික ගිවිසුමේ පාර්ශ්වයක් වේද, පාර්ශ්වයක් නොවන්නේ නම් වෘත්තීය සමිතිය පවසන ආකාරයට 2003 අංක 13 දරන සාමූහික ගිවිසුමේ ඇති කොන්දේසි ඉටු කිරීමට බැඳී ඇත්තේ කුමන නෛතික පදනමක් යටතේ ද යන වග සම්බන්ධයෙන් කිසිදු සාකච්ඡාවක් කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කම්කරු කාර්යාල, කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සම්බන්ධතා අංශය හෝ කම්කරු කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ පැවති කිසිදු සාකච්ඡාවක දී සකච්ඡාවට භාජනය වී නොමැති බව නිරීක්ෂණය වේ.

කෙසේ වුවද, මෙම බේරුම්කරණ යොමුවේ ඇති පරිදි අදාල සාමූහික ගිවිසුමට අනුව සේවායෝජක කටයුතු කර නැද්ද යන්න පිළිබඳව මෙම නඩුවේ දී සලකා බැලිය යුතු ප්‍රධානතම කරුණ වේ. මන්ද යත් සමස්ත බේරුම්කරණ නඩුවම රැඳී පවතින්නේ එකී කරුණ මත බැවිනි. වෘත්තීය සමිතිය විසින් දිගින් දිගටම ප්‍රකාශ කරනුයේ මෙම සාමූහික ගිවිසුම වතු ක්ෂේත්‍රයට අදාල බවත්, තමන් මෙම සාමූහික ගිවිසුම අත්සන් කල පාර්ශ්වයක් වන Joint Plantation trade Union Centre හි සාමාජිකයකු බවත් වන අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු තහවුරු කිරීමක් හෝ තමන් අදාල වෘත්තීය සමිතියේ සාමාජිකයකු වී ඇති ආකාරය හෝ කිසිදු අවස්ථාවක හෙළිකර නොමැත.

අනික් අතට වෘත්තීය සමිතිය විසින් රාජ්‍ය වැවිලි සංස්ථාව හෝ ජනතා වතු සංවර්ධන මණ්ඩලය මෙම සාමූහික ගිවිසුමේ පාර්ශ්ව කරුවකු යන්න කිසිදු අවස්ථාවක සනාථ කර නැත. මෙම සාක්ෂි සටහන් අතර, පළමු පාර්ශ්වයේ සාක්ෂිකාරියගෙන් දෙවැනි පාර්ශ්වයේ නීතිඥ මහතා විසින් හරස් ප්‍රශ්න විමසීමේදී 2022-12-14 දින සාක්ෂි සටහන්වල ගොනුවේ 193 පිටුවේ මෙසේ හරස් ප්‍රශ්න විමසා ඇත.

එනම්:

"ප්‍ර. දෙවැනි පාර්ශ්වය ලෙස සඳහන් වන්නේ යම්කිසි වෘත්තීය සමිති කිහිපයක් සඳහන් කර තිබෙනවා?

උ. වෘත්තීය සමිති 3 ක් සමග ලියාපදිංචි වුණ අනිකුත් වෘත්තීය සමිති කියලා තිබෙනවා. නම් සඳහන් කම්කරු සමිතිවල නම් සඳහන් කරන අතර අවසන් ලෙස සඳහන් කර තිබෙනවා. වෘත්තීය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි වූ කොළඹ 07. ආනන්ද කුමාරස්සාමි මාවතේ අංක 2 දරන ස්ථානයේ ලියාපදිංචි වූ එවැනි සමිති. All Trade Union Registered Under the trade unions Ordinance and having their register Offices at 72, Ananda Coomaraswamy Mawatha, Colombo 7, At 60, Bandaranayaka, Sri Jayawardanapura Mawatha, Welikada Rajagiriya, and at 618-1/2 Galle Road, Colombo 03 Respectively (hearinafter referred to "the union"

එදිනම සාක්ෂි සටහන්වල ගොනුවේ පිටු අංක 194

ප්‍ර. රතු කොඩි සංවිධානය මෙම සාමූහික ගිවිසුමේ සඳහන් ලියාපදිංචි ලිපිනවල පිහිටුවලා තිබිල නැහැ?

උ. එය මම ප්‍රතික්ෂේප කරනවා. මම එය දන්නෙ නැහැ

ප්‍ර. මම ඔබට යෝජනා කරනවා A 87 කියලා සාමූහික ගිවිසුමේ මෙම නඩුවට සම්බන්ධ තමුන්ගේ වෘත්තීය සමිතිය සම්බන්ධයි කියලා සඳහන් කර නැහැ කියලා

උ. ප්‍රතික්ෂේප කරනවා. වෘත්තීය සමිති ආඥා පනත යටතේ රතු කොඩි සංවිධානය ඒ වෘත්තීය සමිති අතරට එනවා

ප්‍ර. මම තමුන්ට යෝජනා කරනවා මෙම ගිවිසුමේ සඳහන් කර තිබෙන්නේ ඒ සඳහන් කර ඇති ලිපිනයේ පදිංචි වෘත්තීය සංගම් මිසක් ලංකාවේ තිබෙන හැම වෘත්තීය සමිතියක්ම නෙමේ කියලා?

උ. මම එය ප්‍රතික්ෂේප කරනවා. වාත්තීය සමිති ආඥා පනතේ ලියාපදිංචි වුණ වෘත්තීය සමිතියක් ලෙසට අපගේ රතු කොඩි සංවිධානය අයිති වෙනවා. එසේම ජොයින්ට් ප්ලාන්ටේෂන් ට්‍රේඩ් යුනියන් සෙන්ටර් කියන වෘත්තීය සමිතියේ එක සාමාජිකයෙක් තමයි රතු කොඩි සංවිධානය. දැනටත් අපි එම වෘත්තීය සමිතියේ සාමාජිකයෝ. ඒ අනුවත් අපි මෙම සාමූහික ගිවිසුමට අදාල වෙනවා "

එමෙන්ම 2023-02-07 දිනැති සාක්ෂි සටහන්වල ගොනුවේ පිටු අංක 202 හි ඇති ප්‍රශ්න හා පිළිතුරු වල මෙසේ සඳහන් වේ. එනම්,

"ප්‍ර. ඒ අනුව මම මහත්මියගෙන් නැවතත් ප්‍රශ්න කරනවා මේ 2003 සාමූහික ගිවිසුම රෙඩ් ප්ලග් නැති නම් රතු කොඩි සංගමයට අදාල රතු කොඩි සංගමය එම ගිවිසුමේ පාර්ශ්වයන් නොවේ කියලා?

පි. මම ඒක ප්‍රතික්ෂේප කරනවා. සාමූහික ගිවිසුමේ අත්සන් තබන වෘත්තීය සමිති 3 ක් තියෙනව ඒකෙන් එකක් තමයි පොයින්ට් ප්ලාන්ටේෂන් ට්‍රේඩ් යූනියන් සෙන්ටර් කියන එක. මෙම වෘත්තීය සමිතියත් සාමූහික ගිවිසුමේ අත්සන් තබන ඒක නියෝජනය කරන වෘත්තීය සමිතියක් අත්සන් කරන කොට මේ වෘත්තීය සමිතියේ සාමාජිකයෙක් හැටියට ලංකා කම්කරු රතු කොඩි සමිතිය ඉන්නවා.

ප්‍ර. දැන් මහත්මිය මෙම සාමූහික ගිවිසුමේ කොතැනකවත් කියලා තියෙනවා ද පොයින්ට් ප්ලාන්ටේෂන් ට්‍රේඩ් යූනියන් එකේ සාමාජිකත්වය දරන අයට සාමූහික ගිවිසුම අදාලයි කියලා කොහොවත් කියලා තියෙනවාද?

පි. එහෙම කියල නැහැ. නමුත් පෙයිනට් ප්ලාන්ටේෂන් ට්‍රේඩ් යූනියන් සෙන්ටර් නියෝජනය කරන්නේ ඉන්න වෘත්තීය සමිති. එතකොට මේ වෘත්තීය සමිතිය වතුකරයේ ඉන්න වෘත්තීය සමිති. මේ සෙන්ටර් එක අත්සන් කරන සාමූහික ගිවිසුම එකේ ඉන්න හැම මෙම්බර් කෙනෙකුටම අදාල වෙනවා”

එදිනම සාක්ෂි සටහන්වල ගොනුවේ පිටු අංක 200 මෙසේ සටහන් වේ. එනම්,

‘ප්‍ර. මම මහත්මියගෙන් අහන්නේ සරල ප්‍රශ්නයක්. මේ 2003 සාමූහික ගිවිසුම වගඋත්තරකාර සංස්ථාවට අදාළයි කියලා ලිඛිත ලියවිල්ලක් තියෙනව ද නැද්ද?

පි. නැහැ. “

ඉහත කරුණු මෙන්ම ඉදිරිපත්කර ඇති ලිඛිත දේශන මෙන්ම ගොනුකර ඇති ලේඛන සියල්ල මෙන්ම ඉදිරිපත්කර සියළුම සාක්ෂි සලකා බැලීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගම මොවුන් හබ කරනු ලබන සාමූහික ගිවිසුමෙන් බැඳී ඇති බවට වන කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බව ඉතා පැහැදිලිව නිරීක්ෂණය කල හැකි වේ. අඩුම තරමින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හෝ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වෙනත් කිසිදු වත්තක මෙම ගිවිසුම අනුව කටයුතු කරන බවක් හෝ පළමු පාර්ශ්වය විසින් තහවුරු කර නොමැත. ඒ අනුව අදාල සාමූහික ගිවිසුමෙහි 1 වන උපලේඛනයෙහි ඇතුලත්ව ඇති වතු සමාගම් හැර වෙනත් කිසිදු ආයතනයක් මෙම සාමූහික ගිවිසුමෙන් බැඳී ඇති බවට වන කිසිදු සාක්ෂියක් මෙම පරීක්ෂණය පුරාවටම ඉදිරිපත් වී නැති බව ද නිරීක්ෂණය කලෙමි. අවම වශයෙන් කම්කරු අමාත්‍යවරයාට කාර්මික ආරාවුල් පනත මගින් ලැබී ඇති බලතල අනුව මෙම සාමූහික ගිවිසුම අනිකුත් වතු කෙරෙහි ද බලපාන බවට වන නියෝගයක් කම්කරු අමාත්‍යවරයා විසින් සිදුකර ඇති බවට වන කිසිදු සාක්ෂියක් හෝ පැමිණිල්ල විසින් ඉදිරිපත් කර නැති බව ද නිරීක්ෂණය කලෙමි.

සාමූහික ගිවිසුම් සම්බන්ධයෙන් වරින්වර සංශෝධිත 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ ඇති ප්‍රතිපාදන කෙරෙහිද අවධානය යොමු කලෙමි. එකී පනතේ 5(2) වගන්තිය මෙසේ දක්වා ඇත.

එනම්,

“ 5(2). සාමූහික ගිවිසුමක් අදාළ වන පාර්ශ්ව සහ වෘත්තීය සමිති කවරේ ද යන වග ද සේවායෝජකයන් සහ සේවකයන් කවරහු ද යන වග ද එම ගිවිසුමෙහි සඳහන් කරනු ලැබිය යුතුය. පනතේ 8 වගන්තිය මෙසේ දක්වා ඇත.

“ 8 (1) යම් සාමූහික ගිවිසුමක් තත්කාලයෙහි වලංගුව පවතී ද 5 (2) වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර එම ගිවිසුමෙහි සඳහන් පාර්ශ්ව, වෘත්තීය සමිති, සේවායෝජකයෝ සහ සේවකයෝ මේ පනතේ කාර්ය සඳහා එම ගිවිසුමෙන් බැඳී සිටින්නෝය. තවද එවැනි ගිවිසුමක නියමයන් එම ගිවිසුමෙන් බැඳී සිටින සේවායෝජකයන් සහ සේවකයන් අතර ඇති කරගන්නා ලද සේවා නියෝග ගිවිසුමේ ව්‍යවස්ථාපිත නියමයන් වන්නේය.

(2) සාමූහික ගිවිසුමකින් බැඳුනු සේවකයන් කිසිවකු යම් කාර්මික ව්‍යාපාරයක සේවයේ නියුක්ත කර සිටිත් නම්, ඒ ගිවිසුමේ සඳහන්ව ඇති සේවා කොන්දේසිවලට හා නියමයන්ට අඩු වාසිදායක නොවන සේවා කොන්දේසි හා නියමයන් ඒ කාර්මික ව්‍යාපාරයේ යොදවා සිටින සෙසු සේවකයන් සම්බන්ධයෙන් ද ඒ ගිවිසුමේ ඊට පටහැනිව විධි විධානයක් ඇත්නම් මිස, ඒ කාර්මික ව්‍යාපාරයේ සේවායෝජකයා විසින් අනුගමනය කළ යුතුය.”

8 (1) Every collective agreement which is for the time being in force shall, for the purposes for this Act, be binging on the parties, trade unions, employers and workmen referred to in that agreement is accordance with the provisions of section 5(2); and the terms and conditions of the agreement shall be implied terms in the contract of employment between the employers and workmen bound by the agreement.

(2) Where there are any workmen in any industry who are bound by a collective agreement, the employer in that industry shall, unless there is a provision to the contrary in that agreement, observe in respect of all other workmen in that industry terms and conditions of employment which are not less favorable that the terms and conditions set out in that agreement.

මෙම ආරාවුලේදී මෙම වෘත්තිය සමිතිය ඔවුන් පවසන 2003 අංක 13 දරන සාමූහික ගිවිසුම හෝ ඔවුන් විසින් සලකුණු කරන ලද 2011 අංක 22 දරන ගිවිසුම මේ වන විට බලාත්මකව පවතින්නේ ද යන්න පිළිබඳව හෝ 2011 පසුව දැනට නීතියේ බලාත්මක බවකින් යුතු සාමූහික ගිවිසුමක් පවතින්නේ ද නැද්ද යන්න පිළිබඳව කිසිදු සාක්ෂියක් ඉදිරිපත්කර ඇති බවක් ද නිරීක්ෂණය නොවේ. පළමු පාර්ශ්වය විසින් දිගින් දිගටම පවසා ඇත්තේ වසර තුනෙන් තුනට සාමූහික ගිවිසුම් සංශෝධනය වෙමින් ඉදිරියට පැමිණ ඇති බව පමණි. අදාල ඉල්ලීමට අදාල කාලවකවානුව තුලදී ක්‍රියාත්මක තත්වයේ පවතින සාමූහික ගිවිසුමක් පැවති බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බව ද නිරීක්ෂණය විය.

නිරීක්ෂණය වූ අනෙක් වැදගත්ම කරුණ වන්නේ පළමු පාර්ශ්වය විසින්ම සලකුණු කරන ලද A 48 ලේඛනයෙහි ඇති සාකච්ඡා සටහන් අනුව වෘත්තිය සමිතිය ප්‍රධාන ප්‍රශ්න 3ක් ගැන කරුණු දක්වා ඇත. ඒ අතර පළමුවැන්න වී ඇත්තේ සාමූහික ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද වීම බව දක්වා ඇත. සාමූහික ගිවිසුමක් බලාත්මකව පැවැතියේ නම් මෙවැනි ඉල්ලීමක් කිරීම කිසි විටකත් සිදු නොවන බව පැහැදිලි කරුණකි.

ඇත්ත වශයෙන්ම සාමූහික ගිවිසුමක් පවතින තාක් අදාල සේවා කොන්දේසි ඉටු කිරීමට පාර්ශ්වයන් බැඳී ඇති බව පවතින නෛතික තත්ත්වයයි. එහෙත් පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති 2009 සිට 2019 දක්වා කාල පරිච්ඡේදය තුල බලපවත්නා සාමූහික ගිවිසුමක් පැවති බව නිරීක්ෂණය නොවන අතර, 2011 වර්ෂයේ A 98 ලෙස සලකුණු කර ඇති සාමූහික ගිවිසුමේ ද මෙම පලමු පාර්ශ්වය අදාල සාමූහික ගිවිසුමේ පාර්ශ්වයක් බව සනාථ කිරීමට අපොහොසත් වී ඇති බව පෙනේ. තවද, මෙම ආරාවුලේ දෙවැනි පාර්ශ්වය වන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හෝ ජනතා වතු සංවර්ධන මණ්ඩලය මෙම ගිවිසුමේ පාර්ශ්වකරුවකු බව සනාථ කිරීමට ද පළමු පාර්ශ්වය අපොහොසත් වී ඇත.

දැන් සලකා බැලිය යුතු වන්නේ සාමූහික ගිවිසුමේ 8 (2) වගන්තිය ප්‍රකාරව අදාල සාමූහික ගිවිසුම ඒ සමාන වෙනත් කාර්මික ව්‍යාපාර සම්බන්ධයෙන් ඇති නෛතික බලපෑම සම්බන්ධයෙනි.

මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීමේදී සැලකිය යුතු කරුණු කිහිපයක්ම පනතෙහි ඇති බව නිරීක්ෂණය වේ. පනතේ 8 වන වගන්තියෙන් ආවරණය වන්නේ අදාල ගිවිසුම අත්සන් කරනු ලබන පාර්ශ්ව වන අතර, 8(2) වගන්තිය ප්‍රකාරව යම් කාර්මික ව්‍යාපාරයක යම් සේවක පිරිසක් එකී සාමූහික ගිවිසුමෙන් ආවරණය වන්නේ නම්, එම කාර්මික ව්‍යාපාරයේ සේවයේ නියුක්තව සිටින සෙසු සේවකයන් සම්බන්ධයෙන් ද අදාල ගිවිසුමේ නියමයන් අනුව කටයුතු කල යුතුය යන්න වේ.

මෙම වගන්තිය ප්‍රකාරව මෙම බේරුම්කරණයට අදාල පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කරනු ලබන 2003 අංක 13 දරන සාමූහික ගිවිසුම එම වත්තේ සේවකයන්ට අදාල බවට කිසිදු සාක්ෂියක් පැමිණිල්ල විසින් ඉදිරිපත් කර නැත. තවද පනතේ ඉහත වගන්තියේ සඳහන් පරිදි රාජ්‍ය වැවිලි සංස්ථාවේ කිසිදු සේවකයකු සම්බන්ධයෙන් මෙම සාමූහික ගිවිසුම බලාත්මක වන බව ද කිසිදු අවස්ථාවක පැමිණිල්ලේ සාක්ෂි මගින් හෝ වෙනත් ආකාරයකින් හෝ සනාථ කර නොමැත.

ඊළගට සලකා බැලිය යුත්තේ කාර්මික ආරාවුල් පනතේ 10 වැනි වගන්තියයි. එම වගන්තිය මෙසේ දක්වා ඇත.

“10 (1) බලපවත්නා සාමූහික ගිවිසුමක පාර්ශ්ව, යම් කාර්මික ව්‍යාපාරයක සේවායෝජකයන්ගෙන් සමන්විත වෘත්තිය සමිති එකක් හෝ ඊට වැඩි ගණනක් ද ඒ කාර්මික ව්‍යාපාරයේ නියුතු සේවකයන්ගෙන් සමන්විත වෘත්තීය සමිති එකක් හෝ ඊට වැඩි ගණනක් ද වන අවස්ථාවක දී. එම පාර්ශ්ව මගින්, ඒ දිස්ත්‍රික්කයේ ඒ කාර්මික ව්‍යාපාරයේ නියුතු හෝ ශ්‍රී ලංකාවේ ඒ කාර්මික ව්‍යාපාරයේ නියුතු හෝ -

(අ) සේවායෝජකයන් හා සේවකයන් හෝ

(ආ) සේවායෝජක පන්තියක් හෝ සේවක පන්තියක්, හෝ

(ඇ) සේවායෝජකයන් හෝ සේවක පන්තියක්, හෝ

(ඈ) සේවා යෝජක පන්තියක් හා සේවකයන් හෝ ප්‍රමාණයන් පරිදි නියෝජනය වන්නේ යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම්, ඒ දිස්ත්‍රික්කයේ ඒ කාර්මික ව්‍යාපාරයේ හෝ ශ්‍රී ලංකාවේ ඒ කාර්මික ව්‍යාපාරයේ හෝ නියුතුව සිටින්නා වූද 8 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ඒ ගිවිසුමින් බැඳී නොසිටින්නා වූද සෑම සේවායෝජකයකු සම්බන්ධයෙන් නැතහොත් ඒ සේවායෝජක පන්තියට අයත් සෑම සේවායෝජකයකු ම සම්බන්ධයෙන් (2) වන උප වගන්තිය යටතේ නියමයන් අමාත්‍යවරයා විසින් කළ හැකිය.

(2) යම් දිස්ත්‍රික්කයක හෝ ශ්‍රී ලංකාවෙහි හෝ පිහිටියා වූ ද, (1) වන උප වගන්තියෙහි සඳහන් පරිදි වූ සාමූහික ගිවිසුමක් අදාල වන්නා වූ ද යම් කාර්මික ව්‍යාපාරයක නියුතු වූ සහ 8 වන වගන්තියේ විධිවිධාන පරිදි ඒ ගිවිසුමෙන් බැඳී නොසිටින්නා වූ සෑම සේවායෝජකයකු ම හෝ යම් පන්තියක සෑම සේවා යෝජකයකුම හෝ විසින්, ඒ ගිවිසුමෙහි ඇතුළත් (මෙහි මින් මතු “ පිළිගත් කොන්දේසි හා නියමයන් යනුවෙන් සඳහන් කරනු ලබන) කොන්දේසි හා නියමයන් හෝ පිළිගත් කොන්දේසිවලට හා නියමයන්ට වඩා අඩු වාසිදායක නොවන

කොන්දේසි හා නියමයන් හෝ පිළිපැදිය යුතු බවට (1) වන උප වගන්තියේ විධි විධානවලට අනුකූලය අමාත්‍යවරයා විසින් නියමයක් කළ හැකි ය.''

මෙසේ අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමයන් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු වේ.

මෙම පරීක්ෂණය පුරාවටම පළමු පාර්ශ්වය විසින් දෙවැනි පාර්ශ්වය මෙම සාමූහික ගිවිසුමෙන් බැඳී සිටි බවට හෝ අමාත්‍යවරයාගේ නියමය පරිදි අදාල සාමූහික ගිවිසුම අනෙකුත් පාර්ශ්ව වෙත බලපැවැත්වෙන පරිදි දීර්ඝ කලා ද යන්න පිළිබඳව කිසිදු කරුණක් තහවුරු කර නොමැත.

2003 අංක 13 දරන සාමූහික ගිවිසුමෙහි අඩංගු වගන්තියක් වරදවා වටහා ගැනීමක් මත මෙම ඉල්ලීම සිදුකිරීමට තමන්ට අයිතියක් ඇති බවට පළමු පාර්ශ්වය කටයුතු කලා ද යන සැකය පැන නගින්නේ ඔවුන් දිගින් දිගටම ලබාදී ඇති සාක්ෂි මත වේ. එනම්,

2022-12-14 දින සාක්ෂි සටහන්වල ගොනුවේ 193 පිටුවේ මෙසේ හරස් ප්‍රශ්න විමසා ඇත. එනම්

" ප්‍ර.. දෙවැනි පාර්ශ්වය ලෙස සඳහන් වන්නේ යම්කිසි වෘත්තීය සමිති කිහිපයක් සඳහන් කර තිබෙනවා?

උ. වෘත්තීය සමිති 3 ක් සමග ලියාපදිංචි වුණ අනිකුත් වෘත්තීය සමිති කියලා තිබෙනවා. නම් සඳහන් කම්කරු සමිතිවල නම් සඳහන් කරන අතර අවසන් ලෙස සඳහන් කර තිබෙනවා වෘත්තීය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි වූ කොළඹ 07. ආනන්ද කුමාරස්සාමි මාවතේ අංක 2 දරන ස්ථානයේ ලියාපදිංචි වූ එවැනි සමිති. All Trade Union Registered Under the trade unions Ordinance and having their register Offices at 72, Ananda Coomaraswamy Mawatha, Colombo 7, At 60, Bandaranayaka, Sri Jauawardanapura Mawatha, Welikada Rajagiriya, and at 618-1/2 Galle Road, Colombo 03 Respectively (hearinafter referred to "the union"

මෙම පිළිතුරෙන් සාක්ෂිකාරිය සාක්ෂි ලබාදී ඇත්තේ " වෘත්තීය සමිති 3 ක් සමග ලියාපදිංචි වුන අනිකුත් වෘත්තීය සමිති කියලා තිබෙනවා " ඇය සාමූහික ගිවිසුමේ ඇති. All Trade Union Registered Under the trade unions Ordinance යන කොටස සම්බන්ධයෙන් අවබෝධ කරගෙන ඇත්තේ වෘත්තීය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි සියළුම වෘත්තීය සමිති ලෙස බවට පෙනී යයි. එනම්, ඉහත දින සාක්ෂි සටහන් වල ගොනුවේ පිටු අංක 194 හි මෙසේ හරස් ප්‍රශ්න වලට සාක්ෂි ලබා දී ඇත.

" ප්‍ර. මම ඔබට යෝජනා කරනවා A 87 කියලා සාමූහික ගිවිසුමේ මෙම නඩුවට සම්බන්ධ තමුන්ගේ වෘත්තීය සමිතිය සම්බන්ධයි කියල සඳහන් කර නැහැ කියලා?

පි. ප්‍රතික්ෂේප කරනවා. වෘත්තීය සමිති ආඥා පනත යටතේ රතු කොඩි සංවිධානය ඒ වෘත්තීය සමිති අතරට එනවා "

මෙම පිළිතුරෙන් ගම්‍ය වන්නේ පළමු පාර්ශ්වය වන පැමිණිලිකාර රතුකොඩි සංවිධානය වෘත්තීය සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි වෘත්තීය සමිතියක් බැවින් එම සමිතිය සාමූහික ගිවිසුමෙහි පාර්ශ්වකරුවකු වන බවයි. මෙය කරුණු වරදවා වටහා ගැනීමකි.

1950 අංක 43 දරන (වරින් වර සංශෝධිත) කාර්මික ආරාවුල් පනතට අනුව සාමූහික ගිවිසුමක් බලපාන්නේ එම සාමූහික ගිවිසුමෙහි නම් සඳහන් පාර්ශ්වයන්ට හෝ අමාත්‍යවරයාගේ බලතල අනුව අදාල සාමූහික ගිවිසුම දීර්ඝ කරන ලද පාර්ශ්වයන්ට බව පවතින නීති තත්ත්වය වේ.

පරීක්ෂණය පුරාවටම පළමු පාර්ශ්වය විසින් සාක්ෂි මෙහෙයවා ඇත්තේ තමන්ට 2003 සාමූහික ගිවිසුම අදාලය යන සිතිවිල්ල මත තම සාමාජිකයන්ට මෙම ආරාවුලේ දෙවැනි පාර්ශ්වය වන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා වතු අධිකාරී විසින් දින 25 ක් වැඩ ලබා නොදුන් බව හා ඒ හේතුවෙන් සාමාජිකයන් මුහුණපා ඇති ආර්ථික, සෞඛ්‍ය, සාමාජික, අධ්‍යාපනික ගැටළු වලට මුහුණ පෑමට සිදු වූ බව සනාථ කිරීම සඳහා වේ.

බේරුම්කරණ යොමුවේ සඳහන් සාමූහික ගිවිසුම තම සාමාජිකයන්ට බලපාන බවට තහවුරු කර නොමැති පදනම මත ඉන් ඔබ්බට මෙහෙයවන ලද සාක්ෂි සම්බන්ධයෙන් සලකා බැලීම අර්ථ විරහිත වේ. මන්ද යත් එම සාක්ෂි සියල්ලම සාමූහික ගිවිසුම ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පැන නැග ඇති කරුණු සම්බන්ධව මෙහෙයවා ඇති බැවිනි. ඔවුන් සපයා ඇති තොරතුරු හා සාක්ෂි බොහොමයක් සත්‍ය වන අතර, ඒ කිසිවක බලපෑමක් අදාල දෙවැනි පාර්ශ්වය වන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව කෙරෙහි ඇති නොවන බව ඉතා පැහැදිලි වේ. මන්ද යත් දෙවැනි පාර්ශ්වය වෘත්තීය සමිතිය විසින් ඉදිරිපත් කරනු ලබන සාමූහික ගිවිසුමේ පාර්ශ්ව කරුවකු නොවන බැවිනි.

අනික් අතට මෙම සාමූහික ගිවිසුම දෙවැනි පාර්ශ්වය හා පළමු පාර්ශ්වය පාර්ශ්වකරුවන් වන සාමූහික ගිවිසුමක් නම් පැමිණිල්ල සිදු කරන ලද මුල් අවස්ථාවේදීම සාමූහික ගිවිසුමේ කොන්දේසි කඩ කිරීම මත නඩු පැවරීමට කම්කරු දෙපාර්තමේන්තුවට හැකියාව තිබුනි. ඔවුන් එසේ නොකර ඇත්තේ මෙම සාමූහික ගිවිසුම කුමන ආකාරයකින් හෝ පැමිණිලිකාර වෘත්තීය සමිතියට බල නොපාන නිසා බව ඉතා පැහැදිලි කරුණකි.

මෙම ආරාවුලට අදාල පළමු පාර්ශ්වය මුහුණපා ඇති තත්ත්වය ශෝචනීය වේ. ඔවුන් මේ සම්බන්ධයෙන් රාජය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය සමග සාකච්ඡා කොට ඉදිරි පියවරකට යොමුවීම ඉතා සුදුසු ක්‍රියා මාර්ගයක් බව පැහැදිලි වේ. මන්ද යත් ඔවුන් අවසානයේ අයැද සිටින්නේ තම සාමාජිකයන්ට දින 25 වැඩ ලබා නොදුන් කාලයට වන්දි මුදලක් හෝ වත්තෙන් අක්කර දෙකක බිම් කොටසක අයිතිය වේ. මේ සම්බන්ධයෙන් තීරණ ගත හැක්කේ අදාල අමාත්‍යාංශයට හා මහා භාණ්ඩාගාරයට පමණි. මන් ද මෙම දෙවැනි පාර්ශ්වය පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායක් වන බැවිනි.

කෙසේ වුවද, බේරුම්කරණයකදී ප්‍රදානයක් ලබාදීමේදී සියළු සාක්ෂි සලකා බලා යුක්ති සහගත සහ සාධාරණ තීරණයක් ලබාදිය යුතුයි. පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති කරුණු සම්බන්ධයෙන් සානුකම්පිතව බලා යම් වන්දි මුදලක් නියම කිරීම කිසිසේත් යුක්ති සහගත නොවන බව මාගේ මතයයි. මන්ද යත් නෛතිකව හෝ අන් ආකාරයකින් සාමූහික ගිවිසුමෙන් බැඳී නොමැති පාර්ශ්වයකට වන්දි මුදලක් ගෙවන ලෙසට නියම කිරීම යුක්ති සහගත හා සාධාරණ තීරණයක් නොවන බව ඉතා පැහැදිලි වේ. අනෙක් අතට සානුකම්පිත හේතු මත බේරුම්කරණ ප්‍රධානයක් ලබාදීමට ද හැකියාවක් නොමැත.

දින 300 වැඩ ලබාදීම සම්බන්ධයෙන් ද ගැටළුවක් පැන නැගී ඇති බව දෙවැනි පාර්ශ්වයේ සාක්ෂිකරුවන් මගින් තහවුරු කර ඇත. මේ සම්බන්ධයෙන් 2023-05-09 දින සාක්ෂි සටහන් වල ගොනුවේ පිටු අංක 255 හි මෙසේ සාක්ෂි ලබාදී ඇත. එනම්,

“ප්‍ර. ඔබගේ වතුයායේ තත්ත්වය අනුව මෙම ඉල්ලීම ප්‍රායෝගික ද කියන්න?

උ. දින 300 ප්‍රායෝගික නැහැ. වසරකට දින 365 ක් තියෙනව. සෙනසුරාදා සහ ඉරිදා වත්තේ වැඩ කරන්නේ නැහැ. පෝය වැඩ නැහැ. තෛයිපොංගල්, දීපාවලී කියල ගත්තම වැඩ කරන්නේ නැහැ. දින 258 ක් පමණ තියෙන්නේ වැඩ දෙන්න. හෙයාර් පාර්ක් වතුයායේ සේවය කරන විට මම 2019 දී ගැහැණු අයට දින 200 ක් වැඩ දීලා තියෙනව. පිරිමි අයට දින 218 ක් පමණ වැඩ දීලා තියෙනවා. මම එන දවසක් සහ දින 218 ක් පිරිමි අයට දීලා තිබෙනවා. මම වැඩට ආව කාලයේදී මේ දවස් 225 ක් වැඩියෙන් වැඩ දීලා තිබෙනවා. පෙලක් අය කැමති වෙලා තියෙනවා අපිට දින 300 කියන එක කරන්න හරියට අපිට පහසුකමක් නැහැ. මම දැන් ඉන්න වත්ත හොඳ දළු තියෙන හොඳ වත්තක් අලුත් තේ වගාවක්, ඒත් මේ වත්තේවත් අපිට දින 300 ක් දෙන්න බැහැ. මම මේ අවුරුද්දේ දින 200 ක් පමණ දීලා තියෙනවා. පෙලක් අය වැඩට එන්නේ නැහැ. හැම මනුස්සයම වැඩට එන්නෙ නැහැ. 20 ක් ලියාපදිංචි වෙලා සිටියට, වැඩට එන්නේ 5ක් 6ක් කවදාවත්ම 20ම වැඩට ඇවිත් නැහැ. ඒ පැත්තබැලුවම එහෙමයි. නිවාඩු දවස් බැලුවම දින 250 ක් පමණ දෙන්න පුළුවන් දින 300 කියන කාරනාව පැහැදීමකුත් නැහැ ප්‍රායෝගිකව දෙන්නත් බැහැ

මීට අමතරව වතුයායට බලපාන දේශගුණික තත්වය පිළිබඳව ද සාක්ෂිකරු සාක්ෂි ලබාදී ඇත. හෙයාර්පාර්ක් වතුයායට ලැබෙන වර්ෂාපතනය පිළිබඳව සංඛ්‍යාලේඛනයක් ආර්.3 ලෙස ද ඉදිරිපත් කර ඇත. තවද, මෙම වෘත්තීය සමිතියට අදාල සේවකයන්ට වත්තේ වැඩ ප්‍රමාණවත්ව ලබාදීමට නොහැකි බැවින් සේවකයන්ට වත්තේ කොටසක් පවරා දී ඇති අතර, එම කොටස නඩත්තු කොට තේ දළු නෙලා වත්තට ලබා දීමට කටයුතු කිරීමට ද ඉඩකඩ සලසා ඇත. සේවකයින්ට ආදායම් මදි බැවින් ආදායම් උපයා ගැනීමට එම ඉඩම් කොටස් ලබාදී ඇති බව ද නිරීක්ෂණය වේ. කෙසේ වුව ද, දින 200 ට වැඩි ප්‍රමාණයක් සේවකයන්ට සේවය ලබාදුන් බවට තහවුරු කිරීමට දෙවැනි පාර්ශ්වය විසින් ලේඛන ඉදිරිපත් කර නොමැති බව පළමු පාර්ශ්වය වෙනුවෙන් හරස් ප්‍රශ්න විමසීමේදී තහවුරු වී ඇත.

තවදුරටත් දෙවැනි පාර්ශ්වය සාක්ෂිකරුවන් මගින් තහවුරු කර ඇත්තේ පැමිණිල්ල මගින් ඉදිරිපත් කර ඇති ඒ 88 ලේඛනයේ සේවය නොසැපයූ දින ලෙස සඳහන් ගනන් දෝෂ සහගත බවත්, එම දින අතර සේවකයන් සේවයට නොපැමිණි දිනයන් ද ඇතුලත් කර ඇති බවත් වේ. තවදුරටත් හරස් ප්‍රශ්න වලට පිළිතුරු සපයමින් සාක්ෂිකරු පවසා ඇත්තේ 2003 අංක 13 දරන සාමූහික ගිවිසුමෙන් රාජ්‍ය වැවිලි සංස්ථාව බැඳි නොමැති බවත්,එම ගිවිසුමේ සඳහන් වතු සමාගම් 20 පමණක් මෙම ගිවිසුමෙන් බැඳී ඇති බවත් වේ.

දිගින් දිගටම අදාල සාමූහික ගිවිසුමේ අදාලත්වයත් දින 25 ලබාදීම සම්බන්ධවත් මූලික ප්‍රශ්න මෙන්ම හරස් ප්‍රශ්න ද විමසීම් කර ඇත. නමුත් මේ කිසිදු සාක්ෂියකින් මෙම 2003 සාමූහික ගිවිසුම රාජ්‍ය වැවිලි සංස්ථාවට අදාල වන බවට කරුණු හෙලිවී නොමැත. පළමු පාර්ශ්වයේ සේවකයන් වෙත දින 25 ක සේවයක් ලබා නොදුන් බව සනාථ වන නමුත් සාමූහික ගිවිසුමෙන් බැඳී නැති පසුබිමක දින 25 සේවය ලබාදීම අනිවාර්ය කිරීම සාධාරණ හා යුක්ති සහගත නොවනවා පමණක් නොව නීතියට අනුව ද එසේ කිරීමට හැකියාවක් නොමැත.

සියළු කරුණු පරීක්ෂා කර බැලීමේදී කිසිදු නෛතික බැඳීමක් නැති සාමූහික ගිවිසුමක් පදනම් කර ගනිමින් පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන්ට වන්දි මුදලක් ලබා දීමට කටයුතු කිරීම සාධාරණ හා යුක්ති සහගත නොවන බව පැහැදිලි කරුණකි. ඉදිරිපත්කර ඇති අනෙකුත් ආශ්‍රිත සාක්ෂි මගින් ද මෙසේ වන්දි මුදලක් ලබාදීමට නියම කිරීමට තරම් කිසිදු යුක්ති සහගත බවක් විද්‍යාමාන නොවේ. මේ අනුව පහත දක්වන ප්‍රදානය සිදුකරන අතර, එය යුක්ති සහගත සහ සාධාරණ ප්‍රදානයක් බව ද සහතික කරමි.

**ප්‍රදානය**

පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති සාමූහික ගිවිසුම අනුව සේවායෝජක එකී සාමූහික ගිවිසුමේ පාර්ශ්වයක් නොවන පසුබිමක සහනයක් පළමු පාර්ශ්වය වෙත ප්‍රදානය කිරීමේ හැකියාවක් නොමැති බව අවධාරණය කරමි. කිසිදු නෛතික බැඳීමක් හෝ වෙනත්

ආකාරයක බැඳීමක් නොමැති සාමූහික ගිවිසුමක් පදනම් කර ගනිමින් යම් වන්දි මුදලක් නියම කිරීම නීතියට පටහැනි වනවා මෙන්ම එය සාධාරණ හා යුක්ති සහගත වන්නේ ද නැත.

ඒ අනුව බේරුම්කරණ යොමුවේ සඳහන් කරුණු අනුව කිසිදු සහනයක් පළමු පාර්ශ්වය වෙත ප්‍රදානය කිරීමේ හැකියාවක් නොමැති බැවින් පළමු පාර්ශ්වයේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සහතික කරමි.

නීතිඥ ඕබඩගේ ලීලාරත්න,
බේරුම්කරු.

2025 ජූලි මස 03 වැනි දින.

E0G 08-0125

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.